| අන්තාඩිය | ගු | - | ඳ | - | ග | - | ති | - |
| | ග | - | ත | - | ගු | - | ඳ | - |
| | ගත් | - | තම් | - | | | | |
| ඉරට්ටිය | ගුං | - | දත් | - | ගුහි | තිග | දිරි | කිට |
| | ග | ත | ග | ත | ගුං | - | දත් | - |
| | ගුහි | තිග | දිරි | කිට | ග | ත | ග | ත |
| | ගුං | - | දත් | - | ගුහි | තිග | දිරි | කිට |
| | ග | ත | ග | ත | ගති | තිග | තම් | - |
| | තත් | - | දිත් | - | තත් | - | දිගතම් | - |
| | - | - | දොං | - | | | | |
| මාත්‍රය | ගු | ද | ග | ති | ග | ත | ගු | ඳ |
| | ගු | ද | ග | ති | ග | ත | | |
| අන්තාඩිය | ගු | - | ද | - | ග | - | ති | - |
| | ග | - | ත | - | ගු | - | ද | - |
| | ගත් | - | - | - | තම් | - | - | - |
| ඉරට්ටිය | ගුං | - | දත් | - | ගුහි | තිග | දිරි | කිට |
| | ග | ත | ග | ත | ගුං | - | දත් | - |
| | ගුහි | තිග | දිරි | කිට | ග | ත | ග | ත |
| | ගුම් | - | දත් | - | ගුහි | තිග | දිරි | කිට |
| | තත් | - | දිත් | - | තත් | - | දිගතම් | - |
| | - | - | දොං | | | | | |

## පට්ටුතාල මාත්‍රය

| / | | | ^ | | ^ | | / | | | ^ | | ^ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ත | හර් | - | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | රැ | ද | දොම් | - |
| ත | හර් | - | රැ | ද | දොම් | - | ග | ති | ත | ග | ත | දොම් | - |
| | | | | | | | | | | ග | ත | | |
| | | | | | | | | | | ග | ත | | |

## අලංකාර පදය

| / | | | ^ | | ^ | | / | | | ^ | | ^ | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
| ජිං | කුද | කුද | තත් | කිට | කිටි | තක | ජිං | කුද | කුද | තත් | කිට | කිටි | තක |

## රසභාව සංකල්ප විස්තර කිරීම.

රස සිද්ධාන්තය නන්දිකේශ්වරගේ අභිනය දර්පණයේ හා භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයේ මැනවින් විග්‍රහ කර ඇත. විවිධ සාහිත්‍යමය අවස්ථා අනුව මිනිසාට ඇති වන හැඟීම් රසභාව යනුවෙන් හැඳින්වෙන බව එහි සඳහන් කරයි. මෙය ගැඹුරින් ම භාරතීය නර්තන සම්ප්‍රදායයන්හි බහුල ව භාවිත කෙරේ. ආරම්භයේ දී භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයෙහි රස අටක් ඇතුළත් ව පැවති අතර, එම රස අටට ශාන්ත රසය එක් වීමෙන් රස නවයක් බවට පත්විය.

රස නිෂ්පත්තියේ දී මුල් වන ස්ථායී භාව නවයකි. ස්ථායී භාවයක් යනු පුද්ගලයකු තුළ ඇති වන්නකි.

උදා : ශෝකය, භය

මෙම ස්ථායී භාවයන් අවස්ථානුරූපී ව වෙනස් වන අතර, එමඟින් රස ජනනයක් සිදු වෙයි.

නව නළු රසය හා ස්ථායී භාව මෙසේ දැක්විය හැකි ය.

| | **ස්ථායී භාවය** | | **රසය** |
|---|---|---|---|
| 1. | රති | - | ශෘංගාරය |
| 2. | හාස | - | හාස්‍ය |
| 3. | ශෝක | - | කරුණ |
| 4. | ක්‍රෝධ | - | රෞද්‍ර |
| 5. | උත්සාහ | - | වීර |
| 6. | භය | - | භයානක |
| 7. | ජුගුප්සා | - | බීභත්ස |
| 8. | විස්ම | - | අද්භූත |
| 9. | ශාන්ත (ශම) | - | ශාන්ත |

පරිසරයේ දක්නට ලැබෙන විවිධ වස්තු හා කලා කෘති යම් යම් සංසිද්ධීන් සමඟ ගැටීමෙන් සාමාන්‍ය ජීවිතයේ දී සිත තුළ යටපත් ව තිබෙන්නා වූ ස්ථායී භාව අවදි වේ.

විශේෂයෙන් බුදු රුවකින් දිස්වන්නේ ශාන්ත භාවය යි. බුදු රුව දකින අප තුළ තැන්පත් ව තිබූ ශාන්ත (ශම) ස්ථායී භාවය අවදි ව බුදු රුවෙන් දිස් වන භාවය ද සමඟ සුසංයෝගී වී අවසානයේ රසයක් බවට පත්වීම ය.

එසේ ම පරිසරයේ විවිධ ශබ්ද ඇති වේ. ඒ අනුව ඇති වන සිතිවිලි වෙනස් වෙයි. හෘද ස්පන්දන වේගය ද ක්‍රමයෙන් අඩු වැඩි වෙයි. එම අවස්ථාවෙන් මිදුණ විට එය සාමාන්‍ය දෙයක් බවට ද පත්වෙයි. එවිට මුහුණෙහි හැඟීම ද ඊට අනුරූපී ව වෙනස් වෙයි. මේ අනුව මෙම සංසිද්ධිය පාදක ව මුහුණෙන් මතු වන්නා වූ භාව විවිධාකාර වන බව පැහැදිලි ය.

මෙම භාව ඉස්මතු වීමේ දී මුහුණේ ඉරියව්වල විවිධත්වයක් ඇතිවේ. මේ සඳහා උපාංගයන්ගේ සුවිශේෂ වෙනස්වීම් පිළිබඳ අවධානයෙන් සිටීම වැදගත් වනු ඇත.

## සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ තුලනාත්මක ව කරුණු දැක්වීම.

### සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ සංස්කෘතික පසුබිම

ශ්‍රී ලංකාව විවිධ ආගම්වලින් හා විවිධ සංස්කෘතීන් ගෙන් යුතු ජනයා වාසය කරන රටකි. එම ජනයා අතර විවිධ ගැමි නැටුම් දක්නට ඇත. එයින් ඇතැම් ඒවා සමාන ලක්ෂණ පෙන්නුම් කරන බවක් ද දැක ගත හැකි ය. ගැමි නැටුම් මඟින් එකී රටේ ජනතාවගේ භාෂාව, ආගම, සිරිත් විරිත්, ඇඳුම් පැලඳුම්, ජීවන වෘත්තීන්, කෙළි සෙල්ලම් ආදී සියලු ම අංග නිරූපණය වෙයි.

බහුවිධ සංස්කෘතික අනන්‍යතා ප්‍රදර්ශනය වනුයේ විවිධ කලාංගවලිනි. මේ අතරින් ගැමි නැටුම් සුවිශේෂ ය. ගැමි ජනයාගේ ජීවන වෘත්තීන්, සිතුම් පැතුම්, ඇදහිලි, විශ්වාස, ආගමික පසුබිම, විනෝදාස්වාද, ඇඳුම් පැලඳුම් ගැමි නැටුම් මඟින් විදහා දක්වේ. බහුවිධ සංස්කෘතික අනන්‍යතා ලක්ෂණ හඳුනා ගනිමින් ඒවායෙහි සමාන, අසමානතා, සුවිශේෂතා පිළිබඳ තුලනාත්මක ව සාකච්ඡා කිරීම ඉතා වැදගත් ය.

ශ්‍රී ලංකාවේ ජීවත් වන බෞද්ධාගමික ජනතාව හා බැඳි සංස්කෘතියට වඩා හින්දු ආගම හා බැඳි දෙමළ සංස්කෘතිය තුළ වෙනස්කම් දක්නට ඇත. ඒ ඒ සංස්කෘතිය අනුව නර්තන ආදියේ ද විවිධතා දක්නා ලැබේ. දෙමළ ජනතාවගේ නර්තන හා අනෙකුත් අංග දකුණු ඉන්දියානු සංස්කෘතික ලක්ෂණයන්ට සමීප බවක් පෙන්නුම් කරයි. සිංහල හා දෙමළ ගැමි නැටුම් හඳුනා ගැනීමත් එහි සුවිශේෂ ලක්ෂණ හඳුනා ගැනීමත් දේශීය ගැමි නැටුම් හා එකී නර්තන අතර ඇති සබඳතා හඳුනා ගැනීමත් වැදගත් ය.

උදා :

| **සිංහල** | **දෙමළ** |
|---|---|
| කළගෙඩි<br>ලී කෙළි<br>ලී මල්ලිය<br>ගොයම් නැටුම<br>කුලු | සෙම්බු<br>කෝලාට්ටම්<br>පින්නල් කෝලාට්ටම්<br>අරවිවෙට්ටු<br>සුලකු<br>කාවඩි<br>කුම්මි |

### කළගෙඩි හා සෙම්බු නැටුම්

කළගෙඩි නැටුමෙන් පිළිබිඹු වන්නේ ගැමි ලියන්ගේ ලාලිත්‍යය යි. කළය ගෙන යෑම, කළ රැගෙන නැටීම, කළගෙඩිවලට දිය පුරවා ගැනීම යන විවිධ අවස්ථා නිරූපණය වෙයි. මෙහි දී නර්තන අංගවල සමානකම් දැක ගත හැකි ය.

සිංහල කාන්තාවන් දිය ගෙනයන්නේ මැටි කළගෙඩිය උකුළේ තබාගෙන ය. එහෙත් දෙමළ කාන්තාවන් සෙම්බුවලට දිය පුරවා හිස මත තබාගෙන යෑම සිරිත යි. නර්තනයේ දී

සෙම්බු අතින් ගන්නා කාන්තාවෝ ඒවා අතින් අතට මාරු කරමින්, උඩ දමා අල්ලමින් හා විවිධ හැඩ මතු වන සේ අතෙහි තබා ගනිමින් පසුබිමින් නැඟෙන සංගීතය අනුව ලාස්‍ය ලක්ෂණවලින් යුත් චලන ඉදිරිපත් කරති.

විශේෂයෙන් කළගෙඩි නැටුම හා සෙම්බු නැටුම බොහෝ දුරට සමාන ලක්ෂණ පෙන්නුම් කරයි. එහි දී එම නර්තන මඟින් ඉදිරිපත් කරන චලන අනුව සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු වෙයි. සිංහල කාන්තාව රෙදි හැට්ටවලින් සැරසෙන අතර, දෙමළ ළඳුන් සාරියෙන් හෝ වළලු කර දක්වා දිග සායකින් හා හැට්ටයකින් හෝ සැරසෙමින් ඔවුන්ගේ නර්තනයන් ඉදිරිපත් කරන අතර, එම නර්තනයන්ට ආවේණික චලන හා සංගීතය යොදා ගනු ලැබේ.

- රංග වස්ත්‍රාභරණවල සුවිශේෂතා දක්නට ලැබීම
- ගායනයෙහි හා වාදනයෙහි ඇති සුවිශේෂ ලක්ෂණ
- විනෝදාස්වාදය සඳහා රචනා වීම
- චලනවල සුවිශේෂතා
- භාවිත කරන භාණ්ඩවල සුවිශේෂතා

## ලී කෙළි හා කෝලාට්ටම් නර්තනය

ලී කෙළි නැටුම සඳහා කිතුල්, කරඳ වැනි අඩියක් පමණ දිග ඇති එක සමාන ලී පොලු දෙකක් යොදා ගැනේ. එහි දී යුගල වශයෙන් නැටීම ලක්ෂණයකි. එසේ ම සරල වාදනයන් සමඟ ගීත ගායනයත්, ලී ගැසීමත් කෝලාට්ටම් නර්තනය තුළ සිදු වේ. මෙම නර්තනයේ සුවිශේෂ ගෙතීම් රටා දැකිය හැකි ය. මෙම ගෙතීම් නැවත ලිහමින් නර්තනයේ චමත්කාරය හා ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරයි.

මෙයට සමාන ව දේශීය වශයෙන් ලී මල්ලිය භාවිත කරමින් ලී කෙළි නැටීම සිදු කරනු ලබයි. මෙය රටා ගෙතීම හා ලී මල්ලියේ (දඟයේ) ගෙතීම යනුවෙන් ව්‍යවහාරයේ පවතී. මෙය රඟ මඬල මැද ලණු සවි කරන ලද ලී කණුවේ ලණු අතින් අල්ලා අතරින් රිංගමින් විරුද්ධ හා ප්‍රතිවිරුද්ධ දිසාවට ගමන් කරමින් නැටීම සුවිශේෂ ලක්ෂණ වේ.

තව ද ගැමි පරිසරයක එළිමහනේ ගස්වල ගැට ගැසූ රෙදි හෝ ලණු හෝ භාවිත කරමින් පින්නල් කෝලාට්ටම් නැටීම සාම්ප්‍රදායික ලක්ෂණයකි. පින්නල් කෝලාට්ටම් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය විසින් ම රංගනය කරනු ලැබේ. මෙම නර්තනයේ දී රඟමඬල මැද තබනු ලබන ලී කණුවෙහි ගැට ගසා ඇති ලණු අතින් අල්ලා ගන්නා නළු - නිළියෝ විවිධ හැඩයන් අනුව ලණු අතරින් රිංගමින් ලී කණුව වටා එකිනෙකා ප්‍රතිවිරුද්ධ ව ගමන් කරති. එහි දී ලණුවලින් ඉතා ම අලංකාර රටාවන් නිර්මාණය වන අතර නැවත ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කිරීමෙන් එය ලිහා ගැනීමට හැකියාව ඇත.

මෙසේ සිංහල හා දෙමළ ගැමි නැටුම් විවිධ අවස්ථාවල දී දැක ගත හැකි ය. පෙරහැර, ප්‍රසංග වේදිකාව, ජනමාධ්‍ය මේ අතර සුවිශේෂ ය. සමාජ, ආගමික, ජාතික හා අන්තර්ජාතික උත්සව අවස්ථාවල දී ද ගැමි නර්තනාංග දැක ගත හැකි ය.

සතුට, විනෝදාස්වාදය හා ආගමික අවශ්‍යතා මූලික කොටගෙන ගැමියා නිර්මාණය කළ ගැමි නැටුම්වලින් සාමූහිකත්වය, සරල බව හා එමකම ප්‍රදර්ශනය වේ.

## නර්තන කලාව හා අනෙකුත් කලාවන් අතර සම්බන්ධතාව

කලා අතර චිත්‍ර, සංගීත, නාට්‍ය, නර්තන විශේෂිත ය. මෙකී කලාවන්ගෙන් සෞන්දර්යාත්මක වින්දනයක් උත්පාදනය වේ. මෙහි අවසාන ඵලය වන්නේ උසස් රසවින්දනයක් ඇති පුද්ගලයන් ලොවට දායාද කරලීම යි.

කලාකෘතියක් නිර්මාණය කිරීමේ දී කලාකරුවකු යම්කිසි කලා මාධ්‍යයක් තෝරා ගත යුතු ය. චිත්‍ර, නර්තනය, සංගීතය හා නාට්‍යය යන කලා අංගවලට අමතර ව කලා මාධ්‍යයන් ලෙස මූර්ති, කැටයම්, කවි ගීත ආදී ප්‍රබන්ධ සාහිත්‍යය, සිනමාව යනාදිය හැඳින්විය හැකි ය.

නර්තනය යනු, රිද්මය ආත්මීය කොට ගත්තකි. නර්තන කලාව තුළ චිත්‍ර කලාව, නාට්‍ය කලාව හා සංගීතය ද බද්ධ වී ඇත. තව ද, නර්තනය තුළ රිද්ම රටාවක් ඇති සේ ම, චිත්‍ර සංගීතය, නාට්‍ය තුළ ඇත්තේ ද රිද්මය යි. මේ අනුව නර්තනයේ දී රිද්මය මඟින් අනුක්‍රමික ව මතු කරන චලන මාර්ගයෙන් කෙනෙකුගේ මනෝභාව ඇති කරන අතර සංගීතයෙන් ශබ්ද හා ස්වර නාද මුසු කොට ගෙන ද, චිත්‍රයක දී රේඛා, වර්ණ, හැඩතල මූලික කරගනිමින් ද මනෝභාව ඇති කරනු ලැබේ. නාට්‍යය යනු, ආංගික, වාචික, සාත්ත්වික ආහාර්යා යන සතර අභිනයන්ගෙන් යුක්ත ව ලෝක පැවතීම් අනුකරණය කිරීමකි. එය සමාරෝපණය ආත්ම කොටගෙන නාට්‍යය බිහි වී ඇත. නර්තනය, නාට්‍යය, සංගීතය, සන්දර්ශන කලා වශයෙන් හඳුන්වන අතර, චිත්‍ර කලාව දෘශ්‍ය කලා යනුවෙන් ද හැඳින්විය හැකි ය.

## නර්තන කලාව හා සබැඳි චිත්‍ර කලාව

චිත්‍ර කලාවේ දී රේඛා හැඩතල වර්ණ යොදා ගනිමින් ජ්‍යාමිතික හැඩතල ඔස්සේ සිතුවමක් නිර්මාණය වේ. එම හැඩතලවල සුසංයෝගය මත සිතුවමේ ප්‍රාසංගික බව රඳා පවතී. නර්තනයේ දී රිද්මය වරින් වර වෙනස් වුව ද, චිත්‍රයේ දී රිද්මය නිශ්චිත ව පවතී. නර්තනයේ දී මෙන් ම චිත්‍ර කලාවේ දී ද අවකාශ භාවිතය අත්‍යවශ්‍ය සාධකයක් වේ. එනම්, සිතුවම් නිර්මාණයේ දී ඒ ඒ අවශ්‍යතාවන් අනුව අවකාශය වෙනස් වේ. තව ද, චිත්‍රයක ගුණාත්මක බව ඇති වන්නේ වර්ණ සංකලනය මඟිනි. චිත්‍ර කලාව තුළ තිබෙන ඇඹීම, නෙළීම යන ක්‍රමවේදයන් නර්තන කලාවට ද අත්‍යවශ්‍ය වන්නේ ශාන්තිකර්ම සැරසිලි හා බලි ඇඹීමේ දී ය. ඇඹීම යනු කොටස් එකතු කරමින් පිළිරුව ඇඹීම යි. නෙළීම යනු කොටස් ඉවත් කරමින් නිර්මාණය කිරීම වේ. පහත දක්වා ඇත්තේ ඊට උදාහරණ කීපයකි.



නෙළීම - බුදු පිළිමය



ඇඹීම - බලියක්

*නර්තනය 11 ශ්‍රේණිය - අතිරේක කියවීම් පොත*

චිත්‍ර කලාවෙන් නර්තන කලාවට ලැබෙන පිටිවහල ඉමහත් ය. ජ්‍යාමිතික හැඩතල සමූහයකින් නිර්මාණය කරගත් නර්තනය වේදිකාවක් මතට ගෙන ඒමේ දී එහි ප්‍රාසංගික ගුණය රඳවා ගැනීම සඳහා රංග වස්ත්‍රාභරණ අවශ්‍ය වේ. එහි දී වර්ණ රේඛා හැඩතල යොදා ගැනීමෙන් හා මනා ලෙස ගැළපීමෙන් එහි අලංකාරය ඇති වේ. චිත්‍රයක දී වුව ද ප්‍රස්තුතයට උචිත පරිදි වර්ණ ගැළපීම එහි ප්‍රාසංගික බව වැඩි කරයි.

චිත්‍රයක දී මෝස්තර, රටා ගොඩ නඟනවා සේ ම නර්තනයේ ද මෝස්තර රටා ගොඩ නඟමින් නිර්මාණයේ යෙදෙනු ලැබේ. මේ අනුව බලන කල, චිත්‍ර කලාව හා නර්තන කලාව එක ම ශිල්ප ක්‍රම, ආකාර දෙකකට භාවිත කර නිර්මාණ කටයුතුවල යෙදෙන බව පෙනී යන කරුණකි.

## නර්තන කලාව හා සබැඳි සංගීත කලාව

නර්තනය සැම විට ම සම්බන්ධ වී ඇත්තේ ගායනය හා වාදනය සමඟ ය. නර්තනය ''චලනය'' මාධ්‍යය කොට ගන්නා සේ ම සංගීතය ශබ්ද හා නාද මාධ්‍යය කොට ගෙන නිර්මාණ ඉදිරිපත් කරයි. නර්තන නිර්මාණ කිරීමේ දී සංගීතය උපයෝගි කර ගනිමින් උසස් නිර්මාණයක් කළ හැකි ය. විශේෂයෙන් ම මුද්‍රා නාට්‍ය ඉදිරිපත් කිරීමේ දී සංගීතය හා නර්තනය ප්‍රබල මෙහෙවරක යෙදෙයි. මුල් ම යුගයේ සිට මිනිසා චලන හා ශබ්ද මුසු කොට නැටුම් ඉදිරිපත් කර ඇත. සංගීතය දෘශ්‍ය කලාවක් ලෙස නොපෙනුණ ද සංගීත නිර්මාණයක් රසවිඳීමේ දී එහි ඇති මනෝභාව තුළ ඇත්තේ විනිවිද දැක්මකි. එය ප්‍රේක්ෂකයාගේ සිත තුළ ජනිත වන චිත්ත රූප මඟින් ඇති වන ක්‍රියාවලියකි. සංගීත නිර්මාණයේ දී රටා ගොඩ නඟයි. ස්වර භාවිත කරමින් අලංකාර රටා ඔස්සේ නිර්මාණකරණයේ යෙදේ. සංගීතඥයා ධ්වනි මාධුර්යය මඟින් ප්‍රේක්ෂක හදවත් තමා වෙත රඳවා ගනී. කෙසේ වෙතත් නර්තන නිර්මාණයක දී සංගීතය යොදා ගැනීම එහි ප්‍රාසංගික ගුණය වැඩි කිරීමට අත්‍යවශ්‍ය සාධකයකි.

## නර්තන කලාව හා සබැඳි නාට්‍ය කලාව

භරත මුනිගේ නාට්‍ය ශාස්ත්‍රයට අනුව නාට්‍ය ශෛලි දෙකකි. එනම්, ලෝකධර්මී හා නාට්‍යධර්මී නාට්‍ය වේ. ලෝකධර්මී නාට්‍ය යනු ලෝකයේ පවතින තත්ත්වය ඒ ආකාරයෙන් ම අනුකරණය කිරීම යි. ලෝකයේ පැවැත්ම වෙනස් ආකාරයෙන් ඉදිරිපත් කිරීම නාට්‍යධර්මී නාට්‍ය ශෛලිය යි. නාට්‍යධර්මී ශෛලියට නාට්‍ය නිර්මාණය කිරීමේ දී නර්තනය බහුල ව යොදා ගැනේ. එහි දී උචිත පද කොටස් හා සංගීතය ද භාවිත කරනු ලැබේ.

කතාව, සංවාද, දෙබස්, නර්තන, ගායන, වාදන ඇතුළත් නාට්‍යමය අවස්ථා දේශීය ශාන්තිකර්ම තුළ කිඳා බැස ඇත. නර්තනය මුල් කරගත් ශාන්තිකර්මවල ඒකාකාරී භාවයෙන් මිදීමට හා ප්‍රේක්ෂක අවධානය රඳවා ගැනීමට නාට්‍යමය පෙළපාලි ඇතුළත් කොට ඇත.

උදා : අඹ විදමන, යක්කම්, ගුරුගේමාලාව, පොත්කඩේ පාලිය, දෙවොල් ගොඩ බැසීම, රාමා මැරීම, මරා ඉපැද්දීම ඉන් සමහරකි.

මෙහි දී නියමිත පද කොටස් නටා, කවි ගායනය කරමින් සංවාදාත්මක ව කතා පුවත ඉදිරියට ගෙන යනු ලැබේ. නාට්‍යයක දී රිද්ම රටා, හැඩතල, සම්බන්ධතා, අවකාශ භාවිතය, දිසා තල භාවිතය වැනි සාධක නර්තනයේ දී මෙන් ම නාට්‍ය කලාවේ දී ද දක්නට ලැබේ.

# 3 පරිච්ඡේදය

## 3.0 සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ හා විකල්ප වාද්‍ය උපකරණ

### බෙර වාදනය හා සබැඳි මූලික සරඹ වාදනය කිරීම

වාදනය පුහුණු කිරීමේ දී තත් ජිත් තොං නං යන මූලික බීජාක්ෂර මත පදනම් වූ බෙර සරඹ පද ගොඩනැඟී ඇත. තත් සහ තොං යන බීජාක්ෂර දෙක බෙරයේ වම් පසින් ද, ජිත්, නං යන බීජාක්ෂර බෙරයේ දකුණු පසින් ද වාදනය කරනු ලැබේ.

### සතර බීජාක්ෂර වාදනය

උඩරට බෙර වාදනය කරන ආධුනිකයකු පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් සතර බීජාක්ෂර වාදනය කළ යුතු ය.

- **තත්** යන අක්ෂරයේ හඬ නිපදවීමේ දී බෙරයේ වම් ඇසට තදින් හඬ පුපුරා යන සේ වාදනය කළ යුතු ය.
- **ජිත්** යන අක්ෂරය වාදනයේ දී දකුණු බෙර ඇසට තදින් හඬ පුපුරා යන ආකාරයට වාදනය කළ යුතු ය.
- **තොං** යන අක්ෂරය වාදනයේ දී බෙරයේ වම් පස ගැටිය අසල ඇඟිලි තුඩුවලින් වාදනය කළ යුතු ය.
- **නං** යන අක්ෂරය වාදනයේ දී දකුණු පස බෙර ඇසේ ගැටිය අසලට සුළැඟිලි ප්‍රදේශයෙන් හඬ විහිදී යන සේ වාදනය කළ යුතු ය.

පහත රට බෙර වාදනය කරන ආධුනිකයකු පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් සතර බීජාක්ෂර වාදනය කළ යුතු ය.

- **තත්** යන අක්ෂරය වාදනයේ දී වම් අතේ මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි 4 බෙරයේ හයි තට්ටුවට (වම) වදින සේ වාදනය කළ යුතු ය.
- **දිත්** යන අක්ෂරය වාදනයේ දී සුරල් තට්ටුවේ ගැටිය අසලට දකුණු අතේ මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි හතරෙන් ධ්වනිය විහිදී යාමට ඉඩ නො දී බෙර ඇස වසා තද කර වාදනය කළ යුතු ය.
- **තොං** යන අක්ෂරය වාදනයේ දී බෙරයේ වම් පැත්තේ ගැටිය අසලට මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි හතරෙන් හඬ විහිදී යන ලෙස වාදනය කළ යුතු ය.
- **නං** යන අක්ෂරය වාදනයේ දී සුරල් තට්ටුවේ ගැටිය අසලට මාපට ඇඟිල්ල හැර අනෙක් ඇඟිලි හතර වදින සේ වාදනය කළ යුතු ය.

දවුල් බෙර වාදනය කරන ආධුනිකයකු පහත සඳහන් උපදෙස් අනුගමනය කරමින් සතර බීජාක්ෂර වාදනය කළ යුතු ය.

- **තත්** යන අක්ෂරය වම් අතින් වම් ඇසට තදින් (හඬ පුපුරා යන සේ) වාදනය කළ යුතු ය.
- **ජිත්** යන අක්ෂරය දකුණු අතින් දකුණු බෙර ඇසට තදින් (හඬ පුපුරා යන සේ) වාදනය කළ යුතු ය.
- **තොං** යන අක්ෂරය වම් අතේ ඇඟිලිවලින් වම් බෙර ඇසේ ගැටිය අසලට හඬ විහිදී යන ලෙස වාදනය කළ යුතු ය.
- **නං** යන අක්ෂරය දකුණු අතේ ඇඟිලිවලින් දකුණු ඇසේ ගැටිය අසලට හඬ විහිදී යන ලෙස වාදනය කළ යුතු ය.

## නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් බෙර වාදනය කිරීම.

- මාත්‍රා 3 + 4 දෙතිතේ තාලයට (මැදුම් මහ දෙතිත) බෙර පද

| | | |
|---|---|---|
| උඩරට | - | දෝං/ජිං ජිං/තකට/දොං තක |
| පහතරට | - | ගුංද/ගතිගත/ගත්ත/ගුදිගුද |
| සබරගමු | - | කුදත්/තක්කිට/තකට/ජිමිතක |

- ඉහත බෙර පද අදාළ තාල රූපයට අනුව තාල තබා කියන්න.
- එක් කණ්ඩායමක් තාල තබන විට අනෙක් කණ්ඩායම පද වාදනය කරන්න.
- 8 ශ්‍රේණියේ සිට ඉගෙන ගත් බෙර පද වාදනය කිරීම.

  බෙරයේ ධ්වනියට අනුව දකුණු පසින් හා වම් පසින් නිපදවෙන හඬවලට ගැළපෙන සේ පද නිර්මාණය වීම වැදගත් ලක්ෂණයකි. මෙසේ පද නිර්මාණය වී ඇත්තේ එම භාණ්ඩයේ ම උපදින ශබ්ද මුල් කර ගෙන බව හොඳින් වටහා ගත යුතු ය. බෙර වාදනය පුහුණු වීමේ දී ඒ සඳහා නියමිත සරඹ 12ක් ප්‍රගුණ කිරීමෙන් අනතුරු ව පද වාදනය කළ යුතු වේ. උඩරට බෙරයේ ශබ්ද ධ්වනියට ම ආවේණික වූ බෙර අක්ෂර සුදුසු පරිදි සංයෝග වීමෙන් බෙර පද නිර්මාණය වේ. බෙර අක්ෂර කීපයක් සංගත වීමෙන් එක් බෙර පදයක් නිර්මාණය වන්නාක් මෙන් ම එවැනි පද කීපයක් එක් වීමෙන් දීර්ඝ බෙර පද (අලංකාර පද) නිර්මාණය වී ඇත.

# 4 පරිච්ඡේදය

## 4.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායයන් හා සබැඳි ගායනාවල පසුබිම හා ගායනය

### ගායනය හා සබැඳි සංස්කෘතික පසුබිම

#### හටන් කවි

හටන් කවි යනු පැරණි රාජධානි සමයේ සිදු කළ ඓතිහාසික සටන් පසුබිම් කරගෙන ගොඩනැඟී ඇති කවි විශේෂයකි. සටනට යාමට පෙර, යුද්ධ ගමනේ දී, යුද්ධ කරන අවස්ථාවේ හා යුද්ධයෙන් පසු අවස්ථා පසුබිම් කර ගෙන හා සටනේ වීරත්වය ඉස්මතු වන පරිදි ගායන රචනා වී තිබීම විශේෂත්වයකි. ඊට අනුකූල වන පරිදි නාදමාලා යොදා ගෙන ඇත. ලන්දේසි හටන, පෘතුගීසී හටන, ඉංග්‍රීසි හටන, දුනුවිල හටන, කුස්තන්තීනු හටන ඊට උදාහරණ වේ.

යුද්දෙටත් ඇවිත් සිදු පිට නැව් නැගිලා පරංගි
උන්නමුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා
අන්දමත් සොඳයි කිසි බිසි ගාලා කොළඹදි
කම්පලත් නැතත් සෙනඟත් මරාදාලා

ලත් තැනින් කියත් බාසෙන් රට ගන්ටා දෙමළු
මත්වෙලත් දොඩත් වෙරිමත පෙන්නන්ටා
කත් ගෙරිත් මසුත් උන්ගේ කුණු පණයන්ටා ළමැද
රත් වෙලත් ගිනිත් සියොලඟ බැරි උන්ටා
(පරංගී හටන)

#### මෝල්ගස් කවි

මෝල්ගස් නැටුම මැතක දී ගැමි නැටුම්වලට එක් වී ඇත. ඒ සඳහා ශාන්ති කර්මවල එන අට මඟලේ කවි යොදා ගැනේ. මෙහි දී මෝල්ගස්වල ස්වභාවය එම කවිවලින් විස්තර වී ඇත. අද්‍යතනයේ මෝල්ගස් නැටුම ප්‍රසංග වේදිකාව සඳහා නිර්මාණය වීමත් සමඟ ම විවිධ මෝල්ගස් කවි ද රචනා වී තිබේ.

දිව් කදුරු ද ගස එතැන තියෙන්නේ
සත් වියතක් දිග මොහොල කපන්නේ
රන් විලි දෙකොනට සොඳින් තබන්නේ
සත් දින දොස හැර දෙපා තබන්නේ

රනේ රුව සෙ වත රුවින් දිලේ දෝ

රනේ බරණ ගත වට සරසා දෝ
රනේ ඔසරි පොට නෙරිය තබා දෝ
රනේ දෙකොන විලි මෝල ගෙනේ දෝ

## ග්‍රහ පන්ති කවි

නව ග්‍රහයන්ගෙන් ඇති වන්නා වූ අපල උපද්‍රව දුරු කර ගැනීම සඳහා පවත්වනු ලබන සම්ප්‍රදාය ත්‍රිත්වයට ම පොදු ශාන්තිකර්මයක් ලෙස බලි ශාන්තිකර්මය හැඳින්විය හැකි ය. ග්‍රහ පන්ති කවි ලෙස හඳුන්වන්නේ එකී ශාන්තිකර්මයේ එන ගායනා විශේෂයකි.

හිරු, සඳ, කුජ, බුධ, ගුරු, සිකුරු, සෙනසුරු, රාහු, කේතු යන ග්‍රහයන් නව දෙනාට අයත් දිශා, විමානය (වෘක්ෂය) ආයුධ, භෝජන, වාහන, දින, පිළිබඳ ව මෙම ගායනාවල සඳහන් ව තිබීම විශේෂත්වයකි. බලි ඇදුරා බෙර වාදනයට අනුව දකුණු අතට අත්මිණිය ගෙන තාලානුකූල ව ගායනා කරමින් සරල නර්තනයක යෙදේ. මෙම ගායනා මඟින් ග්‍රහයන්ට ආරාධනා කිරීම හා ආතුරයාට සෙත් පැතීම සිදු කරනු ලැබේ.

ඉන්ද්‍ර දිශාවට ඉඹුල් විමානෙට හිරු දෙවි අධිපති වන්නේ
රන් සිරිවස ගෙන සුරත දරා ගෙන තුරඟෙකු පිට වැඩ ඉන්නේ
ඇතියම් රෝදුක් දුරැර දමා නිති චිරත් කලක් වැජඹෙන්නේ
ඉන්ද්‍ර දිසාවෙන් හිරු දෙවි වැඩලා ග්‍රහ මෙ දෝස දුර ලන්නේ

කොකුම් පාට කිතුලින් බත් වළඳා ඉඳුරට හිමිවන
අතින් රැගෙන සිරිවසකුත් තුරඟුන් නැගි ඉඹුල් විමන
නිතින් පැමිණ එන උවදුරු ඉරිදා මුල් කොට අරගෙන
දුකින් මුදා සැපත ලැබෙයි ඉරු සෙත් දී ආවඩවන

## පන්තේරු කවි

පන්තේරුව ඝන වාද්‍ය භාණ්ඩයකි.

උඩරට නර්තන සම්ප්‍රදායයට අයත් පන්තේරු නර්තනය සබ නැටුම් විශේෂයක් ලෙස හැඳින්විය හැකි ය. එම නර්තනයේ දී ගායනය කරනු ලබන කවි හඳුන්වන්නේ පන්තේරු කවි ලෙස යි. විශේෂයෙන් අතීතයේ විහාර පන්සල්වල කෙරෙන සූවිසි විවරණ, සත් සති, පන්සාලිස් වස වැනි ආගමික උත්සව අවස්ථාවන්හි දී බුදු ගුණ ගායනය කරමින් නර්තනය කර ඇත. පන්තේරු කවිවල සඳහන් වන අන්දමට පන්තේරුව අතට ගන්නේ පත්තිනි දේවියගේ අවසර ඉල්ලා ගෙන යි.

සිත්ලෙස ලොව සැදි වකු වළල්ලා
නෙත් දස සුරිඳුගෙ නුවරු සියල්ලා
පත්තිනි දෙවිඳුගෙ සලඹ වළල්ලා
ගත්තෙ අතට පන්තේරු වළල්ලා

පත්තිනි දෙවිඳුගෙ සලඹ වළල්ලා
රුතිනි එවැද බැස අවසර ඉල්ලා
නිතිනි බලා අප රැකි මෙ සියල්ලා
අතිනි දරමි පන්තේරු වළල්ලා

## ප්‍රශස්ති

බුදුන්, දෙවියන්, රජවරුන් සහ රදල ප්‍රභූන් ආදීන්ගේ ගුණ වර්ණනා කරන, ඔවුන් ඉදිරියේ ගායනා කිරීම සඳහා රචනා කර ඇති කාව්‍යය ප්‍රශස්ති කාව්‍යය ලෙස හැඳින්වේ.

''පැරකුම්බා සිරිත'' මුල් ම සිංහල ප්‍රශස්ති කාව්‍යය ලෙස පිළිගැනෙන අතර ශ්‍රී නාමය, පවන, නරේන්ද්‍රසිංහ වර්ණනාව, ශෘංගාලංකාරය, ශ්‍රී වික්‍රමාලංකාරය, ඇහැලේපොළ වර්ණනාව ආදිය තවත් ප්‍රශස්ති කාව්‍ය ග්‍රන්ථ කිහිපයකි. ප්‍රශස්ති කාව්‍යය වඩාත් ම ජනප්‍රිය වී ඇත්තේ මහනුවර යුගයේ දී ය. රජු පිළිබඳ ගුණ වර්ණනා කිරීම සඳහා යොදාගත් ගායකයෝ වන්දි භට්ටයන් ලෙස හැඳින්වෙති. ඔවුන් රජුගේ කවිකාර මඩුවේ දී ප්‍රශස්ති කවි ගායනා කොට ඇත. ප්‍රශස්ති වර්ගීකරණයේ දී රාජ ප්‍රශස්ති, බුද්ධ ප්‍රශස්ති, දේව ප්‍රශස්ති යනුවෙන් වර්ග කළ හැකි ය.

1. පානා අසිරි නො හැර බානා දෙනෙත් කුසුම
   බානා පියෙවි බලැති තුංක මේ
   නූනා වැළඳි කමල යානා සදෙද සදෙව්
   වීනා සපිරි සිරිනි සංක මේ
   පීනා සමර සයුර නානා නතන නතබ
   ගානා තෙදිගු නෙතග කුංකු මේ
   සේනා සමග මෙලක නානා සිරින් පවතු
   බූවනාදි පති රාජසිංහ මේ

2. චන්ද නම් යස තේජ කුංකුම ඇන්ද දිගනන් උරතල
   බින්ද සතුරු අඳුරු පැහැර බන්දු කමල සේ
   නන්ද විජය ශ්‍රී වික්‍රම රාජසිංහ නම් අප හිමි
   ඉන්ද්‍ර සිරින් නිති රැක දෙන් කන්ද සුරිඳුනේ
   රාම චන්ද්‍රවිය රිවි කුල නාම ගගන තල බබළන
   රාජ මෙතුම් සිංහල කිවි භෝජ රාජනේ
   තේජ විකුම් යුතු වික්‍රම රාජසිංහ සිරි නම් දරු
   රාජ රත්නමය අප හිමි රාජ රාජනේ

# වන්නම්

- **මුසලඩි වන්නම - උඩරට නර්තන සම්ප්‍රදාය**

මහනුවර යුගයේ රචිත උඩරට වන්නම් දහ අට අතරින් තාල රූප දෙකකට ගායනා කරනු ලබන එක ම වන්නම මුසලඩි වන්නම යි. 'මුසල්' යනු ද්‍රවිඩ බසින් හාවා යන අරුත දනවයි. එසේ ම මෙම වන්නමෙහි අන්තර්ගත ආඩි, නාඩි යන යෙදුම් හා සයනම්, ලන්නම්, වෙවුලුම් වැනි වචනවල ''ම්'' කාරය යොදා ඇති නිසා මෙම වන්නම ද්‍රවිඩ වචනවල ආභාසය ලබා ඇති බව පෙනේ.

මෙම වන්නමට ප්‍රස්තුතය වී ඇත්තේ හාවාගේ ගති ස්වභාවය යි. මෙහි මුල් තාල රූපය වන්නේ මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාලය යි. අනෙක් තාල රූපය මාත්‍රා 3 (මැදුම් තනිතිත) තාලය යි. මෙම වන්නමට යොදා ඇති තාල රූපය, ගායනය, නාදමාලාව හා වචනාර්ථය චිත්ත රූප මැවීමට සමත් වේ. එහි වචනාර්ථය අනුව හාවා බියෙන් සැඟවී සිටීම, කිසිවකු ඇස ගැසුණු විට බියට පත්වීම, වෙවුලීම, තැති ගැනීම, බිය වී වේගයෙන් පැන දිවීම, විමසිල්ලෙන් මොහොතක් බලා සිටීම, හිරු අවරට ගිය පසු එළිමහනට පැමිණ සඳ එළියේ සතුටින් දුව පැන ක්‍රීඩා කිරීම වැනි ක්‍රියාවන් අපූර්වත්වයෙන් කියා පෑමට නිර්මාණකරුවා සමත් වී ඇත.

මෙම වන්නම සාම්ප්‍රදායානුකූල ව නර්තනය කිරීමේ දී ඉහතින් දක්වන ලද ක්‍රියාකාරකම් ප්‍රදර්ශනය නොවන අතර, නිර්මාණ කාර්යයේ දී භාව ප්‍රකාශනය වන අයුරින් නිර්මාණය කරගත හැකි ය.

## ශුද්ධ තාලය සින්දු වන්නම - පහතරට නර්තන සම්ප්‍රදායය

පහතරට සින්දු වන්නම් අතර ප්‍රථම සින්දු වන්නම ලෙස හඳුන්වන්නේ ශුද්ධ තාලය සින්දු වන්නම යි. මෙම වන්නම ගංගා වෘත්තයට අනුව රචනා කර ඇති අතර කවි පද සඳහා ලඝු අක්ෂර පමණක් යොදා තිබීම විශේෂත්වයකි. එසේ ම මෙහි භාෂා ලක්ෂණ දෙස බලන කල පෙනී යන්නේ වියත් පඬිවරයකු විසින් රචනා කරනු ලැබී ඇති බව ය.

ශුද්ධ තාලය සින්දු වන්නම ගායනය කරනු ලබන්නේ මාත්‍රා 2 + 2 + 3 (දෙසුළු මැදුම් තුන් තිත) තාල රූපයට අනුව යි. මෙම සින්දු වන්නමෙන් පැවසෙන්නේ සිරි පිරි ගිරි මුදුනෙහි පවතින්නා වූ සිරි ලකෙහි ප්‍රසිද්ධියට පත් දෙව්ලොවක් වැනි දෙවිනුවර වැඩ වාසය කරනු ලබන පිරිපුන් සඳ මෙන් ශ්‍රීයා කාන්තාව සමඟ වැඩ වසන සුරිඳුනි භක්තියෙන් හා ප්‍රේමයෙන් මා කියනු බස අසනු මැනවි යන්න යි.

කෙසේ නමුත් මෙය භක්තියෙන් දෙවියන්ට ආයාචනා කිරීමත්, දෙවියන් ගෙන් පිහිට පැතීමත් බලාපොරොත්තුවෙන් ගායනා කර ඇති බව පෙනී යයි.

- **කොවුලා වන්නම - සබරගමු නර්තන සම්ප්‍රදායය**

සබරගමු නර්තන සම්ප්‍රදායයේ එන වන්නම් අතරින් කොවුලා වන්නම තාල රූප දෙකකට ගායනා කරනු ලබන වන්නමකි. එහි පළමු තාල රූපය වන්නේ මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය යි. දෙවන තාල රූපය මාත්‍රා 3 + 4 (මැදුම් මහ දෙතිත) තාල රූප යි.

වචනාර්ථයෙන් බලන කල, මියුරු වදනින් සවනත රාව ප්‍රතිරාව නංවන කෝකිලයා මහ ගස් මුදුනේ සිට හඬ නගයි. ඌ පරපුටුවෙකි. සිටු විමානයක් සේ සිතා කොහා බිත්තර දමන්නේ කපුටු කූඩුවක ය. කල් යත් ම බිත්තර මෝරා එළිය දකින පැටවු හඬ නැඟීමට පටන් ගනිති. ඒ අවස්ථාවේ ඔවුන් බැට කන්නේ කපුටාගේ රුවට සමාන වුවත් හඬ අසමාන වන නිසා ය. ලෝක ධර්මතාව අනුව සැම කල්හි ම කිසිවෙකුට බලෙන් අනුන්ගෙන් යැපීමට නොහැකි බව කියා පෑමට මෙය කදිම නිදසුනකි.

මෙහි දැක්වෙන ''මිතුරන්නේ ගයන්නේ'' යනුවෙන් සඳහන් වීමෙන් ගායනා කිරීම සඳහා මෙම වන්නම ද රචනා වන්නට ඇති බව පැහැදිලි වේ.

*** පිටු අංක 8 - 10 දක්වා එන ගායනා මේ සඳහා අදාළ කර ගන්න.**

## නියමිත නාදමාලාව අනුගමනය කරමින් ගායනය කිරීම.

මෙහි දක්වා ඇති ප්‍රස්තාර සටහන් අධ්‍යයනය කර අදාළ මාත්‍රා සංඛ්‍යාවන් ගණනය කරමින් තාල රූප හඳුනා ගත හැකි ය.

අදාළ තාල පිළිබඳ අවබෝධ කොට ගනිමින් දී ඇති කවි නියමිත නාදමාලාව අනුව ගායනා කිරීම වැදගත් වේ.

ස්වකීය හඬෙහි ස්වභාවය හඳුනා ගෙන නිරන්තර අභ්‍යාසයේ යෙදීමෙන් තම ගායන කුසලතා වර්ධනය කර ගත හැකි ය.

## හටන් කවි
## මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| යුද් | - | දෙ | ටත් | - | ඇ | විත් | - | සි | ඳු | පි | ට |
| නැව් | - | - | නැ | ගී | - | ලා | - | ප | රං | - | ගි |
| උන් ' | - | න | මුත් | - | ඇ | විත් | - | කො | ළ | ඹ | ට |
| ගො | ඩ | - | බැ | ස | - | ලා | - | - | - | - | - |
| අන් | - | ද | මත් | - | සො | ඳයි | - | කි | සි | බි | - |
| සි | - | - | ගා | - | - | ලා | - | කො | ළ | ඹ | දි |
| කම් | - | ප | ලත් | - | නැ | තත් | - | සෙ | න | ග | ක් |
| ම | රා | - | දා | - | - | ලා | - | - | - | - | - |

## මෝල්ගස් කවි
## මාත්‍රා 3 (මහ තනි තිත) තාලය

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | / | | | / | | | / | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කවිය | ර | නේ | - | රැ | ව | සෙ | ව | ත | - | - | - | - |
| | රැ | වින් | - | දි | ලේ | - | දෝ | - | - | - | - | - |
| | ර | නේ | - | බ | ර | ණ | ග | ත | - | - | - | - |
| | ව | ට | ස | ර | සා | - | දෝ | - | - | - | - | - |

## මාත්‍රා 4 (මහ තනි තිත) තාලය

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | | / | | | | / | | | | / | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කවිය | + | දිවි | ක | දු | රැ | ද | ග | ස | - | එතැ | න | ති | බෙන් | - | නේ | - |
| | + | සත් | වි | ය | තක් | - | දි | ග | - | මොළහො | ල | ක | පත් | - | නේ | - |

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | | / | | | | / | | | | / | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කවිය | + | + | දි | වි | ක | - | දු | - | රැ | - | ද | - | ග | - | ස | - |
| | + | + | එ | තැ | න | - | ති | - | යෙ | - | න් | - | නේ | - | - | - |
| | + | + | සත් | - | වි | - | ය | - | ත | - | ක් | - | දි | - | ග | - |
| | + | + | මො | හො | ල | - | ක | - | ප | - | න් | - | නේ | - | - | - |

## ග්‍රහ පන්ති කවි
## මාත්‍රා 4 (මහ තනි තිත) තාලය

| | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | / | | | | / | | | | / | | | | / | | | |
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කවිය | + | - | ඉන් | - | ද්‍ර | - | දි | - | සා | - | - | - | ව | - | ට | - |
| | + | + | ඉ | ඹුල් | - | - | වි | - | මා | - | - | - | නෙ | - | ට | - |
| | + | + | හි | රැ | දෙ | - | වි | - | අ | - | ධි | - | ප | - | ති | - |
| | + | - | වන් | - | නේ | - | - | - | - | - | - | - | - | - | - | - |

## මාත්‍රා 3 (මැදුම් තනි තිත) තාලය

| | / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කවිය | කො | කු | ම් | පා | - | ට | ති | තු | ලින් | - | බත් | - |
| | ව | ළ | දා | - | ඉ | ඳු | ර | ට | හි | මි | ව | න |
| | අ | තින් | - | රැ | ගෙ | න | සි | රි | ව | ස | කුත් | - |
| | තු | ර | ගුන් | - | නැ | ගි | ඉ | ඹුල් | - | වි | ම | න |

## මාත්‍රා 4 (මහ තනි තිත) තාලය

| | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කවිය | + | හි | රු | ඉන් | ද්‍ර | - | කො | න | - | කි | වි | අග් | නි | ය | කො | න |
| | + | යා | ම | දි | ගේ | - | කු | ජ | - | වන් | - | නේ | - | - | - | - |
| | + | වෙන | වෙ | න | ආ | - | යු | ධ | - | වෙන | වෙ | න | හෝ | - | ජ | න |
| | + | පා | ට | වර් | - | ණ | ග | ත | - | බඹ | ළන් | - | නේ | - | - | - |

## ප්‍රශස්ති කවි
## මාත්‍රා 3 තාලය (මැදුම් තනි තිත)

| | / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| කවිය | + | චන් | ද | නම් | ය | ස | තේ | - | ජ | කුං | කු | ම |
| | + | ඇන් | ද | දි | ග | ග | නන් | - | උ | ර | ත | ල |
| | + | බින් | ද | ස | තු | රු | අ | ඳු | රු | පැ | හැ | ර |
| | + | බන් | දු | ක | ම | ල | සේ | - | - | - | - | - |

## මාත්‍රා 2 + 3 (සුළු මැදුම් දෙතිත)

| මාත්‍රා | ^ 1 | 2 | / 1 | 2 | 3 | ^ 1 | 2 | / 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | දොං | - | ජි | - | ත | ග | ත | දොං | - | ත |
| කවිය | පා | - | නා | - | අ | සි | රි | නො | හැ | ර |
| | පා | - | නා | - | දෙ | නෙත් | - | කු | සු | ම |
| | බා | - | නා | - | පී | යෙව් | - | බ | ලැ | ති |
| | තුං | ක | මේ | - | - | - | - | - | - | - |
| | බා | - | නා | - | පි | යෙව් | - | බ | ලැ | ති |
| | තුං | ක | මේ | - | - | - | - | - | - | - |

## මාත්‍රා 4 තාලය (මහ තනි තිත)

| මාත්‍රා | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 | / 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බෙර පදය | කු | ද | ග | ත | ග | ත | දොම් | - | කු | ද | ග | ත | ග | ත | දොම් | - |
| කවිය | + | + | ලක්ෂ් | - | මී | - | - | - | - | - | - | - | - | - | - | - |
| | + | + | හු | ජ | වා | - | - | - | සා | - | - | - | - | - | - | ස |
| | ත | - | තු | - | ජ | - | ය | - | + | + | ලක්ෂ් | - | මී | - | - | - |
| | - | - | - | - | - | - | - | - | + | + | හු | ජ | වා | - | - | - |
| | සා | - | - | - | - | - | - | - | + | වී | ර | වි | ජ | ය | ලක්ෂ් | - |
| | මී | - | ශි | ව | කා | - | මී | - | + | නෑ | ර | බා | - | හු | ශි | බ |
| | ර | ය | වි | සු | පේ | - | මි | - | + | සා | රා | - | මෘ | ත | ග | රු |
| | ව | ච | නැ | ති | සෝ | - | මි | - | + | වී | ර | න | රේන් | - | දු | - |
| | සිං | - | හස් | - | වා | - | මි | - | + | + | ලක්ෂ් | - | මී | - | - | - |
| | - | - | - | - | - | - | - | - | + | + | හු | ජ | වා | - | - | - |
| | සා | - | - | - | - | - | - | - | | | | | | | | |

## පන්තේරු කවි
## මාත්‍රා 4 තාලය (මහ තනි තිත)

| | / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මාත්‍රා | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 4 |
| කවිය | + | සිත් | ලෙ | ස | ලො | ව | සැ | දි | චක් | - | ර | ව | ලල් | - | ලා | - |
| | + | + | චක් | - | ර | - | ව | - | ලල් | - | - | - | ලා | - | - | - |
| | + | නෙත් | ද | ස | සු | රි | ඳු | ගෙ | නු | ව | ර | සි | යල් | - | ලා | - |
| | - | - | නු | ව | ර | - | සි | - | යල් | - | - | - | ලා | - | - | - |
| | + | පත් | ති | නි | දෙ | වි | ඳු | ගෙ | ස | ළ | ඹ | ව | ලල් | - | ලා | - |
| | + | + | ස | ල | බ | - | ව | - | ලල් | - | - | - | ලා | - | - | - |
| | + | ගත් | තෙ | අ | ත | ට | පන් | - | තේ | - | රු | ව | ලල් | - | ලා | - |
| | + | - | තේ | | රු | - | ව | - | ලල් | - | - | - | ලා | - | - | - |

මුසලඩි වන්නම , ශුද්ධ තාලය, සින්දු වන්නම, කොවුලා වන්නම පිටු අංක 16 - 19 දක්වා එන ප්‍රස්තාර සටහන මේ සඳහා අදාළ කර ගන්න.

# 5 පරිච්ඡේදය

## 5.0 ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායය හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම

### වන්නම්වල පසුබිම

ශාන්ති කර්මවලින් බැහැර වූ ශාස්ත්‍රීය නර්තන අංගයක් ලෙස වන්නම් හැඳින්විය හැකි ය. වන්නම් යන වචනය ද්‍රවිඩ භාෂාවේ එන වර්ණම් හෙවත් වර්ණනා යන වචනවලින් සිංහලයට බිඳී ආ වචනයකි. මෙහි අදහස වැනුම නොහොත් වර්ණනාව යන්න යි.

උඩරට, සබරගමු යන සම්ප්‍රදායන් දෙකෙහි ම වන්නම් රචනා වී ඇත්තේ කිසියම් ජීව හෝ අජීව හෝ වස්තුවක් මුල් කරගෙන ය. ඒ සඳහා සත්ත්ව, දේව, සිද්ධි හා වස්තු ආදියෙහි ස්වරූපය පදනම් කරගෙන තිබෙන බව රචනා වී ඇති වන්නම්වලින් තහවුරු කර ගත හැකි ය. පහතරට සින්දු වන්නම් රචනා වී ඇත්තේ සෙත් ශාන්තිය පතා ය.

### වන්නම්වල පොදු ලක්ෂණ

- මුල් කාලයේ දී ගායනය සඳහා රචනා වීම.
- තාල රූපයකට අනුව නිර්මාණය වී තිබීම.
- අදහස් ප්‍රකාශ කිරීමෙන් තොර වන අතර සම්ප්‍රදායයන්ට අයත් පද කොටස් නර්තනය කිරීම
- පසුකාලයේ දී වන්නම් නර්තනය සඳහා යොදා ගැනීම.

### උඩරට වන්නම්

උඩරට වන්නම් මහනුවර රාජ සභාව තුළින් බිහි වී ඇතැයි කියනු ලබන අතර, ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ආරම්භ කළ කවිකාර මඩුවේ දී රාජකීයන්ගේ හා වෙනත් ප්‍රභූන්ගේ විනෝදාස්වාදය සඳහා රචනා වූ බව සඳහන් ව ඇත. මෙකී වන්නම් රචනා කිරීම පිළිබඳ විවිධ මත පළ වී ඇත.

### වන්නම් රචනා වීම පිළිබඳ විවිධ මත

රම්මොලවක අධිකාරම්තුමන් විසින් වන්නම් ප්‍රබන්ධ කොට ඇති බවත් මහරජතුමාගේ ගම්වර (නින්දගම්) පවා ලබා ගත් බවත් ජේ.ඊ. සේදරමන් මහතාගේ ''නෘත්‍ය රත්නාකරය'' නමැති කෘතියේ සඳහන් කොට ඇත.

දකුණු ඉන්දියාවේ නාග පට්ටනම් ස්ථානයෙන් ගෙන්වා ගත් ''ගණිතාලංකාර'' බමුණු පඬිවරයා විසින් වන්නම් රචනා කරන ලද බවට තවත් මතයකි.

ගණිතාලංකාර නම් බමුණු පඬිවරයාට පඬුරු පාක්කුඩම් යවා ලංකාවට ගෙන්වා ගත් බවත් ඔහු විසින් රචිත ''නෙර්තමාලය'' නැමති කෘතිය ඇසුරු කොට ගෙන මල්වතු විහාරවාසී හිමි නමක් විසින් වන්නම් රචනා කරන ලද බවත් කිරිඇල්ලේ ඥානවිමල හිමි පවසයි.

මුල් කාලයේ දී උඩරට වන්නම් නරේන්ද්‍රසිංහ රජුගේ විනෝදාස්වාදය සඳහා ගායනා කළ බව සඳහන් වන අතර පසු කාලයේ දී ඒවා නර්තනය සඳහා යොදා ගෙන ඇත. උඩරට සම්ප්‍රදායයට අයත් වන්නම් සංඛ්‍යාව 18ක් වුව ද ඊට අමතර ව නිර්මාණය වූ වන්නම් ලෙස මරඟන වන්නම, සමනළ වන්නම, මහබෝ වන්නම හා හංස වන්නම සඳහන් කළ හැකි ය.

## පහතරට සින්දු වන්නම්

පහතරට සම්ප්‍රදායයට අයත් වන්නම් 32ක් සින්දු වන්නම් යන විශේෂ නාමයෙන් හඳුන්වා ඇත. සින්දු වන්නම් භක්ති කාව්‍ය ලක්ෂණ ප්‍රකාශ කරනු ලබන හෙයින් එය විනෝදාස්වාදයෙන් බැහැර ව යොදා ගත් නර්තන අංගයක් ලෙස සඳහන් කළ හැකි ය. විෂ්ණු නැතහොත් උපුල්වන් දෙවියන්ගේ ගුණ වර්ණනාවන් මෙයට ඇතුළත් ව ඇති අතර ඒ පිළිබඳ විවිධ මත හා අදහස් ද පළ වී ඇත.

## සින්දු වන්නම් රචනා වීම පිළිබඳ විවිධ මත

ජනප්‍රවාදයේ එන කරුණු අනුව අන්ධ බ්‍රාහ්මණයකු තමන්ට පෙනීම ලබා දෙන ලෙස ඉල්ලා විෂ්ණු නොහොත් උපුල්වන් දෙවියන්ට පූජෝපහාර ලෙස සින්දු වන්නම් පෙළ රචනා කළ හයි මතයක් පවතින බව ''සී.ද.එස්. කුලතිලක'' මහතා ''දහ අට වන්නම්'' නමැති සිය කෘතියේ සඳහන් කර ඇත.

ඊට අමතර ව නෙත් අඳ පුද්ගලයකු තමන්ට පෙනීම ලබා දෙන ලෙස ඉල්ලා කවි පන්තියක් රචනා කර දෙන ලෙසට බරණ ගණිතයා නමැති කාව්‍ය රචකයාගෙන් ඉල්ලීමක් කරන ලද බවත් ඒ අනුව බරණ ගණිතයා විසින් සින්දු වන්නම් රචනා කරන ලද බවත් සඳහන් වේ. එම කවි උපුල්වන් දෙවියන් ඉදිරියේ ගායනා කිරීමෙන් ඇස් පෙනීම ඇති වූ බවට තවත් මතයකි.

සින්දු වන්නම්වල භාෂාමය ලක්ෂණ. රචනා ශෛලිය, ආකෘතිය හා කාව්‍යමය ගුණාංග පිළිබඳ ව සලකා බැලීමේ දී දඹදෙණි හා කෝට්ටේ යුගයන් අතර කාලයේ දී මෙම වන්නම් රචනා කරන්නට ඇතැයි නිගමනය කළ හැකි ය.

මෙම සින්දු වන්නම් 32 දම්වැලක පුරුක් මෙන් එකිනෙකට සම්බන්ධ වී තිබීම විශේෂයකි. එක් වන්නමක් අවසන් වන පදයෙන් හෝ අක්ෂරයෙන් අනෙක් වන්නම ආරම්භ වීම සිදු වේ. සෑම සින්දු වන්නමක් සඳහා ම නියමිත වූ තාලයක් හා විරිතක් ඇති අතර, එයින් සින්දු වන්නම හැඳින්වීම ද සිදු වේ.

උදා :

**ශුද්ධ තාලය - ගංගා වෘත්තය**

| | |
|---|---|
| සිරි පිරි ගිරි මුදුනත සුර පුර | ලෙසිනා |
| සිරිලක පවර දෙවි නුවරෙහි වෙසෙස | වනා |
| සිරි සඳ වනැති සිරි කත සමගිව | වෙසෙනා |
| සුරිඳුනි අසන මකියන බස් බැති | පෙමිනා |

**කොණ්ඩනාච්චි තාලය - ග්‍රහකාර වෘත්තය**

| | |
|---|---|
| පෙමින කුළුණු මිතුරු | ගුණෙන් |
| ඇඳින මුනිඳු සඳසෙ | රූප |
| දෙමින දසත දිගැති | පතළ |
| තෙදැති යුගැති රිවිසෙ | තාප |

මෙයට අනුව සෑම සින්දු වන්නමකට ම නියමිත තාලයක් හා වෘත්තයක් ද ඇත. පසු කාලයේ දී එම සින්දු වන්නම්වලට ගැළපෙන පරිදි, බෙර පදය, තානම, කවිය හා සුරල (ඉරට්ටිය) සම්බන්ධ කොට නැටීමට යොදා ගෙන ඇත. මුල් කාලයේ දී මේවාට තිත් ක්‍රමයක් භාවිත නො කළ ද පසු කාලයේ දී තාල හා තිත් ලක්ෂණ සම්බන්ධ කොට ගෙන ඇති බව පෙනේ.

## සබරගමු වන්නම්

සබරගමු නර්තන කලාවට අයත් වන්නම් පිළිබඳ ව තොරතුරු අනාවරණය කර ගත හැකි ඓතිහාසික මූලාශ්‍රය විරල ය. එහෙත් වරින් වර විවිධ විද්වතුන් හා ලේඛකයන් විසින් පළ කරන ලද ලිපි ලේඛන ජනප්‍රවාදයේ හා මුඛ පරම්පරාගත ව එන තොරතුරු විමසා බැලීමෙන් විසිර පවත්නා යම් යම් හේතු සාධක ඒකරාශි කර ගත හැකි වේ.

සබරගමු වන්නම් පූජාර්ථයෙන් බැහැර වූ විනෝදාස්වාදය මූලික අරමුණ කොටගත් නර්තන විශේෂයක් ලෙස සඳහන් කළ හැකි ය. මෙම වන්නම් අතරින් ඇතැම් ඒවා වාද ගී ස්වරූපයක් ගන්නා බව සඳහන් වේ. වාද ගී ගැයීම ද විනෝදාස්වාදය සඳහා ම කෙරෙන්නක් බව සඳහන් කළ හැකි ය. ප්‍රභූන්ගේ නිවෙස්වල හා වලව්වල මෙම වන්නම් ගායනය හා නර්තනය කළ බව සඳහන් වේ.

ඉපැරණි සබරගමු වන්නම් පෙළක් මුල් වරට හමුවන්නේ 1864 කලවානේ ''ධර්මාලංකාර අතපත්තු මුදලි'' විසින් පුස්කොළ පොතක් ආශ්‍රයෙන් කරන ලද සංස්කරණයෙනි. එහි වන්නම් 36ක් සඳහන් වේ. මෙම වන්නම් ප්‍රථමයෙන් සබරගමු මහා සමන් දේවාලයේ දෙවියන් ඉදිරියේ ඉදිරිපත් කළ බව ද කියැවේ.

අනතුරු ව ලිඛිත වන්නම් පෙළක් පිළිබඳ ව සඳහන් වන්නේ 1908 මහවලතැන්න බණ්ඩාර විසින් ආසියාතික සංගමයේ ලංකා ශාඛාවේ කරන ලද දේශනයක් අලලා මුද්‍රණය කළ සඟරාවට ලියන ලද ලිපියේයි. එහි වන්නම් 29ක් සඳහන් වෙයි. 1956 කහවත්ත හිරමඩගම

තියඹරා වත්තේ ඩී.ඩී. යාහින්න විසින් ලියන ලද ' නෘත්‍ය විනෝද යන් ' කෘතිය 1959 ඊ.ඒ. දෙල්ගොඩ විසින් රචිත ' සබරගමු නාට්‍ය කලාව ' ග්‍රන්ථ කාණ්ඩ තුන සබරගමු වන්නම් පිළිබඳ ලිඛිත සාධක වශයෙන් වැදගත් ය.

සබරගමු වන්නම් පිළිබඳ දැනට ලැබී ඇති පැරණි ම තොරතුරු අනුව 36ක් ව තිබූ වන්නම් අතරින් වන්නම් 21ක් අද්‍යතනයේ භාවිතයේ පවතින බව පැහැදිලි ය.

## නර්තන කලාවේ නූතන ප්‍රවණතා

- 1934 වර්ෂයේ රබීන්ද්‍රනාත් තාගෝර්තුමාගේ පැමිණීමත් සමග නර්තන කලාවේ නව ප්‍රබෝධයක් ඇති වීමට පසුබිම සකස් විය.
- පාරම්පරික ගුරුකුලවලට පමණක් සීමා වූ නර්තන කලාව පොදු ජනයා අතර ප්‍රචලිත වීම.
- නර්තනය ඉගෙනීම සඳහා අධ්‍යාපනයට නර්තන විෂය ඇතුළත් වීම හා ගුරුවරුන් පත් කිරීම.
- දේශීය නර්තනයට මුද්‍රා නාට්‍ය, ඉඟිනළු වැනි නව ක්‍රම ඇතුළත් වීම.
- නර්තන ශිල්පීන් හට ජාතික හා අන්තර්ජාතික තත්ත්වයට පිවිසීමට අවස්ථාව උදා වීම.

  උදා : එක්ස්පෝ 67 වැනි ප්‍රදර්ශන
- 1952 රජයේ ලලිත කලායතනය සහ 1956 සංස්කෘතික දෙපාර්තමේන්තුව ආරම්භ වීමෙන් පසු කලායතන බිහිවීම.
- 1972 දී රජයේ පාසල්වලට සෞන්දර්ය විෂය අනිවාර්ය වීම හා එම වසරේ දී සෞන්දර්ය ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ගිරාගම සෞන්දර්ය ගුරු විද්‍යාලයය ආරම්භ වීම.
- 1978 වර්ෂයේ අ.පො.ස. (උ.පෙ.) සඳහා නර්තනය විෂයයක් වශයෙන් ඇතුළත් වීම.
- උසස් අධ්‍යාපනය සඳහා 1974 වර්ෂයේ දී කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධ කොට සෞන්දර්ය අධ්‍යයන ආයතනය ආරම්භ කිරීම.
- 2005 දී කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය පූර්ණ විශ්ව විද්‍යාලයක් බවට පත් කිරීම. (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය)
- නර්තන විෂය සඳහා ආචාර්යවරුන් මහාචාර්යවරුන් බිහිවීම සහ උසස් අධ්‍යාපනය සඳහා විදේශ ගත වීමට අවස්ථාව උදා වීම.
- විවිධ ආයතන බිහි වීම. උදා : ජාතික තරුණ සේවා සභාව<br>සංස්කෘතික මධ්‍යස්ථාන යනාදිය
- විවිධ නර්තන කණ්ඩායම් බිහි වීම.

  උදා : ත්‍රිවිධ හමුදා<br>රාජ්‍ය නර්තන<br>පළාත් හා පෞද්ගලික නර්තන කණ්ඩායම් බිහි වීම.
- තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීම.
- නර්තනය සඳහා පෙර අපර දෙදිග ශිල්පීය ක්‍රම යොදා ගැනීම.
- පර්යේෂණ මඟින් විවිධ නර්තන කෘති රචනා වීම.
- වාණිජකරණය හේතු කොට ගෙන නර්තනය සඳහා කාන්තා දායකත්වය ශීඝ්‍ර ලෙස වර්ධනය වීම.

## කාර්ය පත්‍රිකාව

1. නර්තන කලාවේ ඇති වූ නව ප්‍රබෝධය නිසා සිදු වූ ප්‍රවණතා 3ක් ලියන්න.
2. 70 දශකයේ ආධ්‍යාපනික වශයෙන් නර්තන කලාවේ සිදු වූ වටිනාකම් පෙළ ගස්වන්න.
3. ශ්‍රී ලාංකික නර්තන ශිල්පීන් අන්තර්ජාතික තලයට පිවිසීම නර්තන කලාවට බලපෑ අයුරු පිළිබඳ කරුණු දක්වන්න.
4. තාක්ෂණික දියුණුව නිසා නර්තන කලාවේ ප්‍රබෝධයක් ඇති වීමට බලපෑ කරුණු පිළිබඳ කතාවක් ඉදිරිපත් කරන්න.

## ශ්‍රී ලාංකේය නර්තන කලාවේ සාහිත්‍ය කලා පෝෂණය සඳහා දායක වූ පර්යේෂණාත්මක ලේඛන :

නර්තන විෂය හා සබැඳි ලිඛිත ග්‍රන්ථ රචනය ආරම්භ වී ඇත්තේ විසිවන ශත වර්ෂයේ සිට ය. ඒ අතර නර්තන විෂයයට අදාළ ලිපිලේඛන, සඟරා, පොත් ද භාවිත කෙරේ. පාසල් අධ්‍යාපනය තුළට සෞන්දර්ය විෂයය එක්වීමත් සමඟ ම ඒ පිළිබඳ අවධානය වඩාත් යොමු වී ඇති අතර නර්තන අධ්‍යාපනය විකාශනය වීමේ දී කැලණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය ස්වාධීන විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය විය. (සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය) මෙහි ප්‍රතිඵලයක් ලෙස විශ්වවිද්‍යාල මට්ටමින් පර්යේෂණ කෘති රාශියක් සම්පාදනය කර ඇත.

පර්යේෂණවල නිරත ව ග්‍රන්ථ කරණයෙහි යෙදුණු විද්වතුන් අතරින් උඩරට, පහතරට, සබරගමු නර්තන සම්ප්‍රදායවලට අදාළ ලේඛකයන්ගේ කෘති අතරින් සුවිශේෂ කෘති කිහිපයක් මෙම ක්‍රියාකාරකමින් හඳුන්වාදීමට සැලසුම් කොට තිබේ.

### මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාගේ පර්යේෂණ කෘති

උඩරට නර්තන සම්ප්‍රදායය පිළිබඳ උපාධියක් ලබා ගත් මුදියන්සේ දිසානායක මහතා නර්තන විෂයයේ විද්වතුන් අතරින් මහාචාර්ය පදවියක් ලබා ගත් ප්‍රථම ලාංකිකයා වේ. මෙතුමා සම්පාදනය කර ඇති ග්‍රන්ථ අතරින් පහත සඳහන් ග්‍රන්ථ හඳුනා ගැනීමට යොමු කර තිබේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය මුදියන්සේ දිසානායක | කොහොඹායක් කංකාරිය හා සමාජය (1998) | උඩරට නර්තන සම්ප්‍රදායය | කොහොඹා කංකාරි ශාන්ති කර්මයට ආවේණික සියළු තොරතුරු |
| | සිංහල නර්තන කලාව (1993) | දේශීය නර්තන සම්ප්‍රදායයෝ | නර්තන සම්ප්‍රදාය තුන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු හා නර්තන විකාශනය පිළිබඳ තොරතුරු |

### මහාචාර්ය ජයසේන කෝට්ටගොඩ මහතාගේ පර්යේෂණ කෘති

පහතරට නර්තන සම්ප්‍රදායය පිළිබඳ ව විශ්වවිද්‍යාල උපාධියක් ලබා ගත් රුහුණේ උපන් මෙතුමා සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ප්‍රථම උපකුලපති වශයෙන් සේවය කර තිබේ. නර්තන විෂයය හා සබැඳි ග්‍රන්ථකරණයට යොමු වී සිටිය මෙතුමාගේ ග්‍රන්ථ අතරින් කීපයක තොරතුරු පහත සඳහන් වේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය ජයසේන කෝට්ටෙගොඩ | පහතරට ශාන්තිකර්ම සාහිත්‍යය (1995) | පහතරට නර්තන සම්ප්‍රදාය | පහතරට ශාන්තිකර්මවල දක්නට ලැබෙන රංග ශෛලීන් පැහැදිලි ව හා විස්තරාත්මක ව දැක්වීම. රිද්දි යාගය, සූනියම් ශාන්තිය, මහසොහොන් සමයම, සන්නි යකුම මේවායේ නාට්‍යමය ලක්ෂණ සමයන් පෙළපාලි හා සන්නිවේදන |
| | භාරතීය සම්භාව්‍ය නර්තන කලාව (2001) | භාරතීය නර්තන සම්ප්‍රදායයෝ | භරත නාට්‍ය, කථක්, කථකලි හා මණිපුරි නර්තනය පිළිබඳ තොරතුරු<br><br>රසභාව හා අභිනය පිළිබඳ තොරතුරු |

### මහාචාර්ය තිස්ස කාරියවසම් මහතාගේ පර්යේෂණ කෘති

සිංහල විෂයානුබද්ධ ව මහාචාර්ය ධුරයක් දරූ තිස්ස කාරියවසම් මහතා නර්තනය හා සබැඳි පර්යේෂණ කෘති කිහිපයක් සම්පාදනය කර ඇත. මේ අතරින් පහත සඳහන් කෘති පිළිබඳ තොරතුරු අධ්‍යයනය කිරීම වැදගත් වේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| මහාචාර්ය තිස්ස කාරියවසම් | ශාන්තිකර්ම සහ සිංහල සමාජය (1998) දෙවන මුද්‍රණය | නර්තන හා බැඳි ශාන්තිකර්ම | යක් තොවිල්<br>පත්තිනි දේවිය හා යකුන් පිළිබඳ තොරතුරු<br>විවිධ උපත් කතා<br>ශාන්තිකර්මවල සමාජ සම්බන්ධය |
| | රටයකුම හෙවත් රිද්දි යාගය (1995) | පහතරට නර්තන සම්ප්‍රදාය | රටයකුම යාගයේ<br>පූජාවිධි රටාව<br>රටයකුමේ එන කවි<br>නාට්‍යමය ලක්ෂණ |

### ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මියගේ පර්යේෂණ කෘති

සබරගමුව නර්තන සම්ප්‍රදායය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය ඒ පිළිබඳ පර්යේෂණ ග්‍රන්ථ සම්පාදනය කර ආචාර්ය උපාධියක් ලබාගත් ප්‍රථම ලාංකික කාන්තාව ලෙස නම් කළ හැකි ය. ඒ අතරින් පහත සඳහන් ග්‍රන්ථ පිළිබඳ අධ්‍යයනය කිරීම වැදගත් වේ.

| කර්තෘගේ නම | ලියන ලද කෘතිය | විෂය ක්ෂේත්‍රය | විෂය අන්තර්ගතය |
|---|---|---|---|
| ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මිය | සබරගමු නර්තන කලාව (2000) | සබරගමු නර්තන සම්ප්‍රදායය | සබරගමු නැටුම් පිළිබඳ තොරතුරු දේව ශාන්ති, යක් තොවිල්, ග්‍රහ පන්ති, සබරගමු වන්නම්, එහි නිශ්චිත නාදමාලා සහිත ව ප්‍රස්තාර ගත කොට දැක්වීම ශාස්ත්‍රීය නර්තන නාට්‍යමය පෙළපාලි මාත්‍රා සහ ප්‍රස්තාර කර දැක්වීම ආදි තොරතුරු |
| | සමන් දේවාල පුද සිරිත් (2008) | සබරගමු නර්තන සම්ප්‍රදාය | සමන් දේවාලයේ පෞරාණික චාරිත්‍ර පෙරහැර මංගල්‍යය පිළිබඳ තොරතුරු සහ සමන් දෙවියන් පිළිබඳ මතවාද නිවැරදි කොට සාධක සහිතව ඉදිරිපත් කිරීම. |

### කෝලම් ගැමි නාටකය

කෝලම් යන වචනය සාමාන්‍ය ජීවිතයේ දී අපට නිතර හුරු පුරුදු වන්නේ,

''කෝලම් කරන්න එපා''
''මේක හරි කෝලමක්''
''මාව කෝලමකට ගන්න එපා'' යන වදන්වලිනි. එහි දී විකට ස්වරූපයක් ගම්‍ය වන බව නිසැක ය.

කෝලම් ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශයේ, විශේෂයෙන් ම දකුණු නිරිත දිග ප්‍රදේශවල ඉතා ජනප්‍රිය ගැමි නාටක ක්‍රමයකි. කෝලම් පරපුරවල් අතර රඟපෙළෙහි වෙනස්කම් තිබුණ ද බොහෝ විට සමානතා ද දක ගත හැකි ය. සෑම කෝලම් කණ්ඩායමක් ම කෝලම් කුට්ටම් නමින් හැඳින්වේ. විනෝදාස්වාදය සඳහා ගැමි ජනතාව දීර්ඝකාලීන ව පවත්වාගෙන එන කෝලම් පහතරට සම්ප්‍රදායයට විශේෂ වූ ගැමි නාටකයක් වශයෙන් පෙන්වා දිය හැකි ය.

### කෝලම් කතා පුවත

මහාසම්මත නම් රජතුමාගේ බිසොවට දඬුරුව නැටුම් දැකීමේ ආශාවක් ඇති විය. මෙම පුවත දැනගත් සක්දෙව් රජු විශ්වකර්ම දිව්‍ය පුත්‍රයා කැඳවා පැවසීමෙන් පසු ඔහු මෙසේ මූහුණු කප්වා රජුගේ උයනේ පසෙක තබා ගියේ ය. උයන් පල්ලන් විසින් ඒ බව රජුට සැලකළ

පසු එම මුහුණු ගෙන්වා නළුවන් ලවා කෝලම් මඩුවක් රඟ දැක්වී ය. එය දුටු බිසොවට සිනහ පහළ වී සිතේ උපන් දොළදුක සන්සිඳුණේ ය. එතැන් සිට කෝලම් මෙලොව පැවත එන බව කෝලම් උපතේ කවි ගායනාවලින් කියැවේ.

## කෝලම් නාටක ප්‍රචලිත ප්‍රදේශ

අතීතයේ දී කෝලම් නාටක ව්‍යාප්ත වූ ප්‍රදේශ පිළිබඳ විමසා බලන විට දකුණු මුහුදුබඩ තීරයේ, රයිගම් කෝරළයේ සහ තදාසන්න ප්‍රදේශවලත් කෝලම් නාටක ප්‍රචලිත ව තිබූ බව පෙනේ. ඒ අනුව කෝලම් ප්‍රචලිත ප්‍රදේශ කිහිපයක් පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| අම්බලන්ගොඩ ප්‍රදේශය | : | හිරේවත්ත, මහ අම්බලන්ගොඩ |
| ඇල්පිටිය ප්‍රදේශය | : | පිටගල, උහන්ඕවිට, හත්තක |
| බෙන්තර ප්‍රදේශය | : | බෙන්තර, කෝම්මල සහ සුද්දගොඩ |
| මාතර ප්‍රදේශය | : | මිරිස්ස, උඩුපිල සහ කඹුරුගමුව |
| හොරණ ප්‍රදේශය | : | පොකුණුවිට, බටුවිට, ඕලබොඩුව |
| ගම්පහ ප්‍රදේශය | : | බටුවත්ත, ගණේමුල්ල, බෙම්මුල්ල, විගඩ |

## කෝලම් නාටක පැවැත්වීමේ අරමුණු

කෝලම් ගැමි නාටකය පැවැත්වීමේ අරමුණු අතීතයේ සහ වර්තමානයේ ද දක්නට ලැබේ. අතීතයේ,

- පූජාර්ථය
- සශ්‍රීකත්වය
- විනෝදාස්වාදය

වර්තමානයේ,

- විනෝදාස්වාදය
- සමාජ විවරණය හා සමාජ ශෝධනය
- අධ්‍යයන කාර්ය

වශයෙනි.

මහා සම්මත රජුගේ බිසොවට ඇති වූ දොළදුක පදනම් කර ගනිමින් ගර්භ සංරක්ෂණයක් සඳහා සහ අතීතයේ දී පූජාර්ථය මුල් කර ගෙන ද කෝලම් නැවත පැවැත්වූ බව කෝලම් පුරාවෘත්තයෙහි සඳහන් වේ.

## කෝලම් රඟමඬල

කෝලම් නාටක රඟමඩල තානායම්පොළ නමින් හඳුන්වයි. කෝලම් නාටක එළිමහන්, වටකුරු රඟමඩලක රඟ දක්වන අතර, නළුවන්ට, මුවා වී රඟමඩලට පැමිණීම සඳහා කවාකාර රඟමඩලේ පිටුපසින් ගොරක අතු සිටුවා බුරුල්ල අතුවලින් ආවරණය කළ වෙස් අත්තක් ඇත. පසෙකින්, කෙසෙල් පතුරෙන් සහ ගොප් කොළයෙන් සරසන ලද මල් සහ පහන් පැලකි. රංග භූමිය වටා ලණු ඇද ගොප් රැහැන් ඇද ප්‍රේක්ෂකයන් සහ රඟමඩල වෙන් කර සීමා පනවා

ඇත. එක් පසෙකින් කාරියකරවන රාල සිටින අතර බෙර වාදකයා, හොරණෑ වාදකයා සහ අත්වැල් ගායකයෝ ද වාඩි වී සිටිති. රඟමඬලට පසෙකින් කාල පන්දම් ගස සිටුවා පඬුරු බැඳ ඇත. (මෙය හිරේවත්ත විජේසූරිය කෝලම් පරපුරේ පමණක් දක ගත හැකි වේ.) නළුවන් රඟමඩලට පැමිණීමට පෙර ඇඳුම් පැළඳුම් මාරු කිරීම සඳහා වෙස් අත්ත පිටුපස පොල් අතු මඩුවකි. රංග භූමිය වටේට ආලෝකය ලබා ගැනීම සඳහා කොප්පරා පහන් දල්වා ඇත.

## කෝලම් නාටකයේ ගායනය

කෝලම් නාටකය තුළ ගායනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ. කෝලම් ආරම්භයේ සිට අවසානය වන තෙක් ම සියලු චරිත සිද්ධීන් සහ චරිතවල ස්වභාවයන් ද ගායනාවලින් හඳුන්වා දෙයි. කාරියකරවන රාල හෙවත් පොතේගුරු ගායනය සිදු කරන අතර අත්වැල් ගායක කණ්ඩායම ඒ සඳහා සහාය වෙති. හොරණෑ වාදකයා ගායනයට මුල පුරයි. ආසාතාත්මක සහ අනාසාතාත්මක කවි ගායනා කෝලම් මඩුවේ අන්තර්ගත යි.

### ජසකෝලමේ එන කවි,

| | | |
|---|---|---|
| පෙර සිට පැවත එන | - | සිරිතට පොදිය බැඳගෙන |
| උරපිට තබාගෙන | - | යෝධ ජසයා ඒය දුවගෙන |
| | | |
| මේ ගම් පියසේ හේනේ මාමල | - | කොච්චර සිටියත් මංවගෙ වෙන නැත |
| රජවාසලයෙන් සළුපිළි අරගෙන | - | එන්නෙමි රජු වඩිනා පෙරමුණයට |
| | | |
| මං වගෙ පේඩි කතක් මනා | - | දුටුවා ද ලොවේ රුසිරෙන් දිනා |
| මං කළ පෙර පවකින් ගෙනා | - | මට හිමිවුනෙ නාකි වූ වෙසමුණා |

කවි ගායනය ආසාතාත්මක ගායනා වශයෙන් පෙන්වා දිය හැකි ය. සෑම චරිතයක් ම සභාවට පැමිණීමට පෙර කෙටි කවි ගායනය මඟින් එම චරිතය හඳුන්වා දීම කෝලම්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

## කෝලම් නාටකයේ වාදනය

ප්‍රධාන වාද්‍ය භාණ්ඩය වශයෙන් පහතරට බෙරය වාදනය කරනු ලැබේ. ඊට අමතර ව සුසිර වාදන භාණ්ඩය ලෙස හොරණෑව භාවිත කරනු ලැබේ.

මඟුල් බෙර වාදනයෙන් කෝලම් නාටක ආරම්භ කරයි. කෝලම් නාටකය තුළ පහතරට ශාස්ත්‍රීය බෙර පද වාදනය වන අවස්ථා දකිය හැකි ය.

'' ගුඳ ගති ගත ගුඳ ගුඳ ගති ගත'' - (නාග කන්‍යා, ගුරුළු රාක්ෂ, අණබෙර කෝලම් වැනි නර්තනාංගවල)

'' ගති ගත ගුම් රිම් ගත ගති ගත ගතිත ගතම්'' - (මුදලි කෝලම, ගිරිදේවි වැනි නර්තනාංගවල)

සරල පද, ගමන් තාල මෙන් ම සංකීර්ණ පද ද කෝලම් නාටකය තුළ අන්තර්ගත ය.

## කෝලම් නාටකයේ නර්තන

කෝලම් නාටකය කවි, සංවාද සහ නර්තන අංගයන්ගෙන් සමන්විත වූවකි. එහි චරිත රඟමඬලට ප්‍රවිෂ්ට වන්නේ නර්තනය මාධ්‍යය කොට ගනිමිනි. කෝලම් චරිත මූලික ලක්ෂණ සැලකිල්ලට ගෙන ප්‍රධාන කොටස් තුනකට වෙන් කරනු ලැබේ.

මානුෂ චරිත - ජසයා, ලෙංචිනා, මුදලි, නොංචි, හේවා, පොලිස් අණබෙර, මරක්කල, හෙංචා, ලියනාරච්චි

අධිමානුෂ චරිත - (මනඃකල්පිත) නාගරාක්ෂ, ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නාගකන්‍යා, ගරුඬ රාක්ෂ, පූර්ණක රාක්ෂ, නරසිංහ අවතාර

සත්ත්ව චරිත - සිංහ, වලස්, ගොන්, කොටි, නරියා

සමස්ත කෝලම් නාටකයේ චරිත නිරූපණ කාර්යයේ දී නර්තන අන්තර්ගත අවස්ථා කිහිපයක් සහ සුවිශේෂ නර්තන අංග පහත පරිදි වර්ග කළ හැකි ය.

| **චරිත නිරූපණ කාර්යයේ දී නර්තන අංග** | **සුවිශේෂ නර්තන අංග** | **කතා පුවත්** |
|---|---|---|
| **පූර්ව රංග** | **අපර රංග** | **අපර රංග** |
| අණබෙර කෝලම<br>නොංචි කෝලම<br>ජස කෝලම<br>ලෙංචිනා කෝලම<br>හේවා කෝලම<br>මුදලි කෝලම<br>ආරච්චි කෝලම<br>කරපිට කෝලම | නාගරාක්ෂ කෝලම<br>නාගකන්‍යා කෝලම<br>ගුරුළු රාක්ෂ කෝලම<br>මරු රාක්ෂ කෝලම<br>පූර්ණක රාක්ෂ කෝලම<br>ගරුඬ රාක්ෂ කෝලම<br>සුරඹා වල්ලි කෝලම<br>පංචනාරීඝට කෝලම<br>නාරිලතා කෝලම<br>සිංහ කෝලම<br>ගොං කොටි කෝලම | සඳ කිඳුරු<br>මනමේ<br>කාපිරි<br>අන්ධභූත<br>වෙස්සන්තර |

## කෝලම් නාටකයේ රංග වස්ත්‍රාභරණ

වෙස් මුහුණු පැලඳ නැටීම කෝලම් නාටකයේ සුවිශේෂ ලක්ෂණයකි. පූර්ව රංග කොටසට අයත් පණිවිඩ කෝලම්වල චරිත නිරූපණ අවස්ථාවල දී සාමාන්‍ය ඇඳුම් පැලඳුම් භාවිත කෙරේ. ජසයාගේ චරිතයේ දී සරම, බැනියම සහ ලේන්සුව රංග වස්ත්‍ර ලෙස යොදා ගැනීම නිදසුනක් ලෙස දැක්විය හැකි ය. අපර රංග කොටසට අයත් සුවිශේෂ නර්තන අංගවල දී නර්තනයට උචිත රංග වස්ත්‍රාභරණ භාවිත කෙරේ. රාක්ෂ නැටුම්වල දී රාක්ෂස විලාසය දැක්වෙන පරිදිත් සුරඹා වල්ලිය නාරිලතා වැනි නර්තන අංගවල දී කාන්තා නර්තනයට උචිත වන පරිදි රංග වස්ත්‍රාභරණ යොදා ගෙන ඇත.

## කෝලම් නාටක චරිත මගින් සමාජ විවරණයක් සිදු කෙරෙන ආකාරය

කෝලම් නාටක පැවැත්වීමේ ප්‍රධානතම අරමුණ විනෝදාස්වාදය ලබා ගැනීම ද කෝලම් චරිත සහ ඔවුන්ගේ චර්යා උපහාසාත්මක බව මතු කර දක්වන බව ද දක්නට ලැබේ.

කෝලම් නාටකවල හාස්‍ය රසය මතුකර දක්වන මුදලි තුමා, ආරච්චි රාල වැනි ගමේ ප්‍රභූ චරිත ප්‍රතිනිර්මාණයේ දී ඔවුන් තුළ ඇති ඇතැම් දුර්ගුණ සහ සටකපටකම් ද, ඔවුන්ගේ චරිත ලක්ෂණ ද කලාකරුවාගේ නිර්මාණය මගින් උපහාසාත්මක විවේචනයකට හසු කර ගන්නා ලදි. එමගින් කිසියම් ආකාරයක සමාජ විවරණයක් ද, එය ඇසුරු කොට ගනිමින් සමාජ ශෝධනයක් ද, සමාජයේ ජීවත් වන ඇතැම් පුද්ගල චරිතවල දෙබිඩි පිළිවෙත ද උපහාසාත්මක ව හෙළිදරවු කිරීමෙන් සමාජය වෙත කිසියම් පණිවිඩයක් ලබා දීම සිදු විය.

මේ අනුව ගමේ ඉහළ පහළ සියලු ම තරාතිරම්වලට අයත් චරිත කෝලම් නාටකය මගින් උපහාසාත්මක විවේචනයට හසුකර ගත් අතර එමගින් යම් ආකාරයක සමාජ විවරණයක් ද සැපයෙන බව පෙනේ.

# 6 පරිච්ඡේදය

## 6.0 විවිධ කලාංගවල සෞන්දර්යාත්මක ලක්ෂණ

### රූපවාහිනී නාළිකාවල දක්නට ලැබෙන නර්තන අංග

රූපවාහිනිය අද්‍යතන යුගයේ සැම නිවසක ම දක්නට ලැබෙන සුලබ පාරිභෝගික භාණ්ඩයකි. එම නිසා රූපවාහිනී වැඩසටහන් නැරඹීමේ ඉඩ ප්‍රස්තාව වැඩි වශයෙන් පොදු ජනතාවට ලැබේ. මෙහි දී රූපවාහිනී ප්‍රේක්ෂකයන් වෙනුවෙන් නාළිකා ගණනාවක් බිහි වී ඇත. එකකට එකක් නොදෙවෙනි වැඩසටහන් ඉදිරිපත් කෙරෙන නිසා ප්‍රේක්ෂකයන් මනා අවබෝධයකින් වැඩසටහන් තෝරා ගැනීම කළ යුතු ය. කෙසේ වෙතත් නර්තන කලාවේ ඉදිරිගමනට රූපවාහිනියෙන් ලැබෙන පිටිවහල ඉමහත් ය.

නර්තනය තාක්ෂණික ක්‍රම ශිල්ප හා බැඳුණේ රූපවාහිනියේ සම්ප්‍රාප්තියක් සමඟ ය. වෙනදා ශාන්තිකර්මයට ගමේ උත්සවයකට සීමා වූ නර්තනය රූපවාහිනිය පිවිසීමත් සමඟ ශ්‍රී ලංකාවාසීන් අතර පමණක් නොව, අන්තර්ජාතික තලය දක්වා ද ලාංකේය නර්තන කලාව ජනප්‍රිය වන්නට විය. රූපවාහිනිය මඟින් විසුරුවා හරින නර්තන වැඩසටහන් එක වර විශාල ප්‍රේක්ෂක සංඛ්‍යාවකට නැරඹීමට හැකි වීම ද මෙහි විශේෂත්වය යි.

### රූපවාහිනියෙන් විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන්

රූපවාහිනියෙන් විකාශය වන අද්‍යතන නර්තන වැඩසටහන් අතර ''සංචලන'' ''පැහැසරණිය'' වැනි වැඩසටහන් නර්තනය හා සබැඳි දැනුම වැඩි දියුණු කර ගැනීම සඳහා ඉවහල් වේ. උසස් කලා කෘති බිහි කළ ශිල්පීන් සමඟ කරන සාකච්ඡාමය වැඩසටහන් ද, නර්තන කලාව හදාරන දරුවන්ට ඉමහත් ප්‍රයෝජනයක් වන අතර ගැටලු නිරාකරණය කර ගැනීමට ද එය රුකුලක් වේ.

අද්‍යතනයේ සැම රූපවාහිනී නාළිකාවක ම ජනප්‍රියතම වැඩසටහන් වශයෙන් ''රියැලිටි ෂෝ'' නැතහොත් dancing star, Little star, රණවිරු ස්ටාර් වැනි ''තරු''බිහි කරන වැඩසටහන් ද අද්‍යතන නර්තන ශිල්පීන්ගේ දක්ෂතාව කියාපෑමට ගත් උත්සාහයකි. ''කවිතා'' වැනි උසස් තත්ත්වයේ වැඩසටහනක් රූපවාහිනී මාධ්‍යයකින් මිස පොදු ජනයාට නැරඹීමට අවස්ථාවක් නො ලැබේ. එනිසා එවැනි වැඩසටහන් සම්පාදනය කොට එළිදක්වන රූපවාහිනී නාළිකාවලට ගෞරව කළ යුතු වන අතර ඉහත දක්වා ඇති රූපවාහිනී වැඩසටහන් කාලීන ව වෙනස් වන බැවින් නව වැඩසටහන් නිෂ්පාදනයට යොමු කළ යුතු ය.

### විචිත්‍රත්වය සඳහා යොදා ගන්නා තාක්ෂණික ක්‍රමශිල්ප

රූපවාහිනී මාධ්‍යයෙන් එළිදක්වන නර්තනවල විචිත්‍රත්වය සඳහා විවිධ තාක්ෂණික ක්‍රමශිල්ප භාවිත කරනු ලැබේ. මෙසේ අද්‍යතන නර්තනයේ ප්‍රාසංගික ගුණය ඉස්මතු කිරීමෙහි ලා තාක්ෂණය යොදා ගැනීම පහත දක්වා ඇති අයුරින් සිදු වේ.

- අධිවේගී/මන්දවේගී දර්ශන
- සමීප - දූරස්ථ දර්ශන
- ප්‍රතිබිම්බ නිර්මාණය
- ගායනය/වාදනය තාක්ෂණික උපාය මාර්ගවලින්
- හඬ පාලනය හා සුසර කිරීම
- අවශ්‍ය රූපය පමණක් ඉස්මතු කොට පසුබිම ඉවත් කිරීම
- ආලෝකකරණය

## රංග වස්ත්‍රාභරණ යොදා ගැනීම

තාක්ෂණික ක්‍රමශිල්පවලට අමතර ව අද්‍යතන නර්තනාංගවල විචිත්‍රත්වය සඳහා රංග වස්ත්‍රාභරණ යොදා ගැනීම එහි ඖචිත්‍යයට බලපායි. රංග වස්ත්‍රාභරණ යොදා ගැනීමේ දී,

- වර්ණවල ගැළපීම
- නර්තන සම්ප්‍රදායයට අදාළ වීම
- සංස්කෘතියට ගැළපීම
- නිර්මාණාත්මක බව

යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් ය. සංගීතය යොදා ගැනීම නිසා නූතන වේදිකා නර්තනවල විචිත්‍රත්වය වැඩියෙන් පෙනේ. මෙසේ යොදා ගන්නා සංගීතය සඳහා ශ්‍රව්‍යපට භාවිත කිරීම ද විශේෂත්වයකි. අද්‍යතන ''රියැලිටි'' වැඩසටහන් නැරඹීමේ දී විනිශ්චය මණ්ඩලයේ හරවත් උපදෙස්වලට ප්‍රේක්ෂකයෝ හා ඉදිරිපත් වන තරගකරුවෝ අවධානයෙන් සවන් දෙති. එහි දී නර්තනය පිළිබඳ විශාල දැනුමක් එකතු කර ගනු ලැබේ. මෙය අද්‍යතන නර්තන කලාවේ දියුණුවට හේතුවන කරුණකි. තවද මෙම ''රියැලිටි'' වැඩසටහන් වලින් බිහිවන නර්තන ශිල්පීහු රටේ උසස් නිර්මාණාත්මක කලාකෘති බිහිකිරීම සඳහා දායකත්වය දරන්නෝ වෙති.

## 6.2 වෙනත් සංස්කෘතියකට අයත් නර්තන සම්ප්‍රදායයෝ

### මනිපුරි නර්තන සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශ, සංගීතය, වාද්‍ය භාණ්ඩ, නර්තන අංග, රංග වස්ත්‍රාභරණ සහ අංග රචනය

ඉතා මටසිලුටු, නම්‍යශීලීත්වයෙන් යුතු ලාස්‍ය අංග චලන භාවිතයක් දක්නට ලැබෙන මනිපුරි නර්තන ශෛලිය උත්තර භාරතීය ඊශාන දිග භාරතයේ මනිපුරි ප්‍රාන්තයේ ප්‍රභවය වූ පැරණි නර්තන සම්ප්‍රදායයකි. මෙම නර්තන සම්ප්‍රදායය සම්පූර්ණයෙන් ම ආගමික හා සමාජීය පසුබිමක් මත ගොඩනැගී ඇත. මනිපුරි දේශය බිහිවීම පිළිබඳ ව විවිධ රසවත් කතා පුවත් ගෙතී ඇත.

1. ශිව දෙවියන් හා පාර්වතී දේවිය සම්බන්ධ කතා පුවත්
2. රාධා හා ක්‍රිෂ්ණ ගේ ප්‍රේමාන්විත කතා පුවත්

මෙම නර්තනයට පසුබිම් වී ඇත. 20 වන සියවසෙහි මුල් භාගයෙහි රබීන්ද්‍රනාත් තාගෝර්තුමා විසින් මෙම නර්තන ශෛලිය ශාන්ති නිකේතනයේ විෂයයක් ලෙස ඉගැන්වීම ආරම්භ කෙරිණි.

## මනිපුරි නර්තන සම්ප්‍රදායයේ සංගීතය හා නර්තනාංග

උත්තර භාරතීය රාගධාරී සංගීතයට අනුකූල ව පසුබිම් සංගීතය සකස් වී ඇතත් මනිපුරි දේශයට ආවේණික විශේෂතා රැසක් ඒ තුළ අන්තර්ගත ව පවතී.

මනිපුරි නර්තනය සඳහා භාවිත වන ප්‍රධාන පසුබිම් සංගීත භාණ්ඩ හතරක් දක්නට ඇත. ඒ අතරින් ප්‍රධානත්වය හිමිවන්නේ පුංග් නම් වූ අවනද්ධ භාණ්ඩයට යි. මෙය ලීයෙන් තනා ඇති අතර මැදින් මහත් ව දෙකෙළවර ක්‍රමික ව සිහින් ව සකසා ඇත. ඉතා ළඟින් ළඟ යොදා ඇති හම් වරපටිවලින් ශක්තිමත් කෙරේ. එක් ඇසක් අඟල් 6ක විෂ්කම්භයකින් යුක්ත වන අතර, අනෙක් ඇස අඟල් 4ක විෂ්කම්භයකින් ද යුක්ත ය. දෙපසෙහි ම බදාම යොදා තිබීම ද සුවිශේෂ ලක්ෂණයකි. වාදනය කරන අවස්ථාවන්හි දී සුදු රෙදිකඩකින් බඳ ආවරණය කරයි.

වර්තමානයෙහි මෙම වාද්‍ය භාණ්ඩයට අමතර ව බටනළාව, හක් ගෙඩිය, එස්රාජය හා තාල නම් වූ ලෝහමය තාලම් පොටක් ද පසුබිම් වාද්‍ය භාණ්ඩ ලෙස යොදා ගනු ලැබේ.

දේවාලයවල ගැයෙන ස්තෝත්‍ර සඳහා ''පෙනා'' නම් වූ තත්වාද්‍ය භාණ්ඩය ද භාවිත කරනු ලැබේ.

## මනිපුරි රංග වස්ත්‍රාභරණ

### කාන්තා රංග වස්ත්‍රාභරණ (රාධාගේ හා ගෝපිකාවන්ගේ)

කුමින් - ගෝපිකාවන්ගේ ඉඟටියේ සිට වළලුකර තෙක් වැසෙන සේ සකස් කළ බැරලයක ආකෘතිය ඇති සාය මේ නමින් හැඳින්වේ. මෙය රන් රිදී නූලෙන් අලංකාර මෝස්තර සහිත ව ගෙත්තම් කර ඇත. තැනින් තැන පළිඟු කැට හා තුනී කණ්ණාඩි කැබලි අල්ලා දිස්නය හා චමත්කාරය ලබා ගෙන ඇත.

පොශ්වාන් - කුමින් ඇඳුමට (සායට) උඩින් ඒ මත විනිවිද පෙනෙන සුදු පැහැති දුහුල් රෙද්දෙන් මසන ලද කෙටි සාය මේ නමින් හැඳින්වේ. එය ඉතා අලංකාර රැළි සහිත ව දිස් වූ චමත්කාරය වැඩි කරන රංගවස්ත්‍ර කොටසකි.

ක්වංගොයි - ඉණට පලඳින පටිය

රිෂම්පුරිට් - උඩුකය සඳහා අඳිනු ලබන විල්ලු ද හැට්ටය රිෂම්පුරිට් නමින් හැඳින්වේ. මෙය කළු, රතු හෝ කොළ පැහැති තද වර්ණයන් ගෙන් සැකසී ඇත. එහි අත්, කර, ඉඟ පෙදෙස රන්වන් බෝඩරවලින් අලංකාර කර තිබේ.

මයිකුම් - හිසට පලඳින වේලය

කොක්තුම්බි - හිස් පලඳනාව

කුදොස් - දැතට පලඳින වළලු විශේෂයකි

කුණ්ඩලානි - කනට පලඳන කරාබු

**පිරිමි රංග වස්ත්‍රාභරණ (ක්‍රිෂ්ණ ගේ)**

ධෝතිය - යටිකයට අඳිනු ලබන ඇඳුම මේ නමින් හැඳින්වේ. මෙය ගෙත්තම් කර අලංකාර කරගනු ලබයි.

මකුට පලඳනාව
(චූරා) - ක්‍රිෂ්ණ සඳහා පමණක් වෙන් වූ සුවිශේෂ ගෞරවයක් දක්වන්නා වූ ආභරණයකි. මෙය මොනර පිහාටුවක ආකෘතියකින් සරසා තිබීම ද විශේෂත්වයකි.

කුදොස් - දැතට පලඳින වළලු විශේෂයකි.

## මනිපුරි නර්තන අංග

රාස්ලීලා - රාධා හා ක්‍රිෂ්ණන් ප්‍රේම වෘත්තාන්තය තේමා කර ගනිමින් මෙම අංගය නිර්මාණය වී ඇත. විවිධ උත්සව අවස්ථා නියෝජනය කරන ලද රාස්ලීලා වර්ග හතක් මනිපුරි නර්තනයට අදාළ ව පවත්වා ගෙන එන ලදි. මේවා අතරින් මහාරාස් වසන්තරාස්, කුංජරාස්, නෘත්‍ය රාස් නම් වූ පංචරාස් මෙහි දී සුවිශේෂ වේ.

පරෙංග් - මනිපුරි නර්තනයෙහි මූලික අභ්‍යාස වන චාලිවල සුවිශේෂ පද කොටස් පරෙං නමින් හැඳින්වෙන අතර ඒවා ද වර්ගීකරණය කර ඇත.

පුංග්චෝලම් - ''පුංග්'' නම් වූ බෙරය කරෙහි ලාගෙන කණ්ඩායමක් විසින් කරන ලද බෙර වාදන නර්තනයකි. මෙය ඉතා සංකීර්ණ බවින් යුක්ත වන අතර විවිධ ආගමික හා සමාජීය අවස්ථාවල දී රඟ දක්වනු ලැබේ.

කර්තාල් චෝලම් - විවිධ තාල මත කෙරෙන සාමූහික තාලම් නර්තනයකි.

සංකීර්තන් - සමාජීය ජන ජීවිතයේ සිදු වන උත්සව අවස්ථා ලෙස සැලකෙන කන් විදීම, බත් කැවීම, විවාහය ආදියේ දී සංකීර්තන් නටනු ලැබේ.

# 7 පරිච්ඡේදය

## 7.0 අත්දැකීම් ඇසුරු කරගනිමින් ප්‍රාසංගික කලාංග නිර්මාණය

### ප්‍රාසංගික නර්තන අංගයන් නිර්මාණය කිරීම.

''වාසනා දිනෙකි මේක'' ගීතයට නර්තන නිර්මාණය

නිර්මාණකරණයට පදනම් වී ඇත්තේ පුද්ගලයාගේ සහජ ළැදියාවන් වන අනුකරණය යි. මිනිස් ස්වභාවයේ ඇති විශේෂ ලක්ෂණයක් වන්නේ ද යම් සිද්ධියක් හෝ ක්‍රියාවක් අනුකරණය කිරීමේ දී ඒ හා බැඳි අන්තර්ගතය අධ්‍යයනය කිරීම යි. අධ්‍යයනයෙන් ලද අත්දැකීම් ඇසුරු කර ගෙන පුද්ගලයා තුළ ඇති සහජ හැකියාවන් ඔස්සේ නිර්මාණයට යොමු වීම වඩා වැදගත් ය.

### අපේක්ෂිත අරමුණු

- නිර්මාණ සඳහා අවශ්‍ය නිරීක්ෂණයන් කිරීම, ශක්තීන් දියුණු කිරීම.
- ආත්ම ප්‍රකාශනයට යමකු තුළ ඇති සහජ ළැදියාවට මං පෙත් සලසා දීම.
- සාම්ප්‍රදායිකත්වයෙන් මිදී නිර්මාණාත්මක චින්තන ශක්තිය වර්ධනය කිරීම.

### විජයතුමා තම්මැන්නේ ගීතය

| | | |
|---|---|---|
| පද රචනය | - | ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි |
| සංගීතය | - | විශාරද සුදත් සමරසිංහ |
| ගීත රචනය | - | විශාරද සුදත් සමරසිංහ |

1 ගීතය :

විජයතුමා තම්මැන්නේ පිරිවර සෙන් සමඟින්නේ
සිටි සැටි දූන් සිහි වෙන්නේ මගේ පුතා නැළවෙන්නේ
අත්තනගලු වනයේ දී මඟියකු හට හිස දන් දී
බුදු බව පැතු සඟබෝදී, සිහි කරපන් සිත පැහැදී
ගොස් මාගම්පුර පවරා අප මහ නා දෙරණිසුරා
මාගම් රජ පරම්පරා ඇති කොට විසුවේ එවරා
කවියකු සේ ඇඳ පැලඳා පඬුවස් දෙව් මහ නිරිඳා
මාගං පුරෙන් ගොඩ බට දා මඟුලක් වී ලක වුවදා
ගොස් දඹදිව් තලයෙහි සිටි පෙර අප සිහළෙක් බුහුටි
මුනි එසඳා ගෙනා සැටි නුඹටත් දූන ගන්න වටී
දනන් කෙරෙන් මෙලක් දිවේ පළමු ව බොදු බැති වූවේ
අප පියතිස් නරනිඳු වේ ඉගෙන ගනින් මගේ පුතේ
එන දිවි පුත් රට වෙනුවෙන් ජාතික දරුවන් ලැබුවෙන්
හිදී නොයෙක් සතරු මුවෙක් ලක්මව විසුවාය සුවෙන්

පද රචනය - ජෝන් ද සිල්වා ඇතුළු කණ්ඩායම
සංගීතය -
ගීත රචනය -

2 ගීතය : වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ
වාසනා දිනේකි මේක පාමු තුටින් ..............

නර්තන නිර්මාණයේ දී එහි ප්‍රාසංගිකත්වය සඳහා විවිධ ක්‍රමවේදයන් භාවිත කළ යුතු ය. එහි දී නිර්මාණයට අදාළ වන ප්‍රස්තුතය පිළිබඳ මනා අවබෝධයක් තිබීම වැදගත් ය.

වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ වාසනා දිනේකි මේක පාමු තුටින්
පාමු තුටින් නටමු මේ ලී දරා අතේ //

කෝමල මධුර බසිනි මේ ගී
සාදා පවසමු දැන් ................................
නටමු පේලි පේලි ගැසී - රජිඳා තුටු වන මෙන්
සිරියා වාසාය වේ - ආශා වී භූපති //
තේජසා තිබේය දීපෙ - ආලෝක වී අපේ
තේජසා තිබේය දීපෙ - ආලෝක වී
ආලෝක වී රජිඳු - බෝ ප්‍රීති වී අපි //
තේජසා තිබේය දීපේ ......................

නට නට කිංකිණි නාද දීමෙනි යමු පාරේ 'තුති' පිදී බොහෝ සේ
භූපති ලක වැජඹේවා//
නිතිනා නිරෝගි වේවා - රාජා මේ සිංහලේ//
වාසනා දිනේකි මේක පාමු තුටින් සිතේ
වාසනා දිනේකි මේක පාමු තුටින්

මෙම ගීතය තාලය මත ම නිර්මාණය වී ඇතත් රිද්මයානුකූල ව ගැයෙන අනාඝාතාත්මක කොටසක් ද ඇතුළත් වී ඇත. ශ්‍රී වික්‍රම නූර්තිය නමින් හැඳින්වෙන මෙම නූර්ති ගීතය කන්නසාමි කුමාරයා ශ්‍රී වික්‍රම නමින් රජ වීමේ ප්‍රීතිය නිමිත්තෙන් රාජ වාසලේ මොහොට්ටාල ඇතුළු පිරිස රාජ සභාවට විත් රජ පිනවීම උදෙසා රජුගේ ගුණ ගායනා කරමින් ගයන ලද ගීතයකි. රජ වාසලේ නර්තන කණ්ඩායම ලී දෙකක් අතට ගෙන ලී කෙළි නර්තනයක ස්වරූපයෙන් නර්තනයේ යෙදී ඇති බව විද්‍යමාන වේ. මේ සඳහා නිලමේවරුන් සියලු දෙනා ම සහභාගි වී ඇති බව කියැවේ.

## නර්තන නිර්මාණයේ දී සැලකිය යුතු කරුණු :

- ගීතය හොඳින් ශ්‍රවණය කර ගායනය කිරීම.
- ගීතයේ පද සහ ගති ස්වභාවය හොඳින් අවබෝධ කර ගැනීම.
- තාලය, රිද්මය, ප්‍රකාශනය පිළිබඳ අවධානය යොමු කිරීම.

- ගීතයට උචිත චලන නිර්මාණය කිරීම.
- නර්තන නිර්මාණයේ දී අවකාශ භාවිතය, තල භාවිතය, දිසා භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීම.
- සාමූහිකත්වයෙන් යුතු ව නර්තන නිර්මාණය කිරීම.
- රංග රටා යොදා ගනිමින් නිර්මාණය කරගත් චලන මගින් ප්‍රාසංගික නර්තන අංගයන් නිර්මාණය කිරීම.

## ප්‍රාසංගික ලක්ෂණ ප්‍රදර්ශනය වන පරිදි අංග රචනය කිරීම

අංග රචනය විග්‍රහ කිරීමේ දී අංග යනුවෙන් අදහස් කරන්නේ මුහුණ ප්‍රධාන කොට ඇති ශරීරයේ අඟ පසඟ වේ. අඟ පසඟ චරිතයේ ස්වභාවයට අවශ්‍ය පරිදි සවිස්තරාත්මක ලෙස ඉදිරිපත් කිරීම රචනය යනුවෙන් අදහස් කරයි. වර්ණ හා හැඩතල උපයෝගි කර ගනිමින් කෙනෙකුගේ බාහිර පෙනුම චරිතයට උචිත පරිදි ලෙස හැඩ ගැන්වීම අංග රචනය යනුවෙන් හැඳින්විය හැකි ය.

ප්‍රාසංගික නර්තනයක් ඉදිරිපත් කිරීමේ දී ශිල්පියාගේ බාහිර ස්වරූපය වෙනස් නො වන පරිදි ස්වාභාවික පිහිටීම මනා ලෙස ඉදිරිපත් කිරීම ස්වාභාවික අංග රචනය වේ. අංග රචනයේ දී සිදු වන්නේ වර්ණ භාවිතයෙන් (රේඛා මාධ්‍යයෙන් හෝ වර්ණ ගැන්වීම මඟින් හෝ මුහුණේ හැඩතල උද්දීපනය කිරීමකි. මෙම ක්‍රියාවලියේ දී භාවිත කරන ශිල්ප ක්‍රමය නම් වර්ණ භාවිත කරමින් ත්‍රිමාණ බව මතු කිරීමට අනුගමනය කරන අඳුර එළිය නම් ශිල්ප ක්‍රමය යි.

- **නර්තන අංගයක් සඳහා අංග රචනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු**
  - මුහුණේ පිහිටීම සහ ස්වභාවය පිළිබඳ අධ්‍යයනය කිරීම.
  - මුහුණේ ප්‍රධාන කොටස් අවබෝධ කර ගැනීම.
    (නළල, ඇස්, නාසය, කම්මුල්, මුඛය සහ නිකට)
  - මුහුණට සාපේක්ෂ ව බෙල්ලේ සහ අත්වල මූලික ආලේපනය යෙදීම. (Base make up)
  - ශිල්පියාගේ සමේ වර්ණය ගැන සැලකිලිමත් වීම.

- **අංග රචනයේ දී භාවිතයට ගන්නා ද්‍රව්‍ය**
  - මූලික ආලේපන
  - ස්පොන්ච් කැබැල්ලක්
  - අයිබ්‍රෝ පෙන්සිල්
  - අයි ෂැඩෝ
  - ලිප්ස්ටික්
  - අයිලදාෂස්

# 8 පරිච්ඡේදය

## 8.0 නර්තන කලාවෙන් ලැබෙන මානසික හා ශාරීරික ස්වස්ථතාව

### නර්තන කලාව හැදෑරීමේ වටිනාකම

කලාකෘති නැරඹීමෙන් හා ඒවායේ යෙදීමෙන් රසවින්දන ශක්තිය වර්ධනය වන අතර එම සැබෑ වින්දනයෙන් ලබන්නා වූ ආත්ම තෘප්තිය අපමණ ය. නර්තනයේ දී කෙරෙන ප්‍රායෝගික ක්‍රියාකාරකම්වලින් ශරීර ශක්තිය වර්ධනය වීම මෙන් ම කලාකෘතියක් නැරඹීම් නිරෝගී මනසක් ඇතිවීමට ද ඉවහල් වේ. මෙයින් ආත්මීය වශයෙන් යහපත් ප්‍රතිඵලයක් ලබා ගත හැකි ය. එසේ ම මේ මඟින් ලබන මානසික උත්තේජනය ජීවිතයේ යහපැවැත්ම කෙරෙහි නිතැතින් ම බලපානු ඇත.

### ඉන්ද්‍රිය සමායෝජනය

ප්‍රායෝගික ව නර්තනය හැරීමෙන් ඉන්ද්‍රිය සමායෝජනයක් සිදු වන අතර, මෙයින් සිරුරේ සමබරතාව ඇති වේ. සිරුරේ නම්‍යශීලී බව, රුධිර සංසරණ පද්ධතියේ ක්‍රියාකාරිත්වය නිසි අයුරින් සිදුවීමෙන් නීරෝග මනසක් හා නීරෝග සිරුරක් පවත්වා ගැනීමට හැකි වේ. යහපත් දිවිපෙවෙතකට ඉවහල් වන ක්‍රියාශීලී බව ඇති කිරීමට නර්තනය ඉවහල් වේ.

### සාරධර්ම වර්ධනය

නර්තනය මඟින් ඉවසීම, දැරීම, අන්‍ය කලාකෘති ඇගයීම, සමානාත්මතා සංකල්පය, නායකත්වයට ගරු කිරීම, එකමුතුව වැඩ කිරීමට හුරු වීම ආදි වශයෙන් ආකල්පමය වශයෙන් වටිනාකම් රාශියක් ජීවිතයට එකතු වේ. උදා : කණ්ඩායම් ක්‍රියාකාරකම්වල දී නායකත්වයට ගරු කරමින් සාකච්ඡා මඟින් නිවැරදි තීරණවලට එළඹීම ආදියෙන් ඕනෑ ම පොදු කටයුත්තක දී නිවැරදි අයුරින් තම දායකත්වය ලබා දීමට පුද්ගලයකු නිතැතින් ම හුරු කෙරෙනු ඇත.

එසේ ම තරගකාරී අවස්ථාවන්හි දී අන්‍ය කලාකෘති අගයමින් ඉවසීමකින් යුතු ව කටයුතු කිරීමට තමා තුළ ඇති වන යහපුරුදු තම ජීවිතයේ හමු වන ඕනෑ ම අභියෝගයකට මුහුණ දීමට ඉවහල් වේ. එසේ ම ඕනෑ ම දෙයක් පිළිබඳ ව නිවැරදි තීන්දු තීරණ ගැනීමටත්, හෘදය සාකෂ්‍යයට අනුව කටයුතු කිරීමටත් හැකියාවක් ඇති කරවයි.

තව ද වැඩිහිටියන්ට, ගුරුවරුන්ට ගරු කිරීමටත් නිරන්තරයෙන් ම හුරු වීමක් සිදු වෙයි. නර්තනය ආරම්භයේ හා අවසානයේ ගුරුවරයාගේ පාද නමස්කාර කිරීම සිදු වන අතර ආධුනිකයාට මුලින් ම හුරු කරනු ලබන්නේ ද නමස්කාරය යි.

වැඩිහිටියන්ට ගරු කිරීම නර්තන විෂය හැදෑරීමේ දී වර්ධනය වන උසස් ගුණාංගයකි. විශේෂයෙන් වැඩිහිටිකමට හා ප්‍රවීණත්වයට මුල්තැනක් දෙමින් ඔවුනට ගරු බුහුමන් දැක්වීම සිදු කෙරේ. තව ද ශාන්තිකර්ම අවස්ථාවන්හි දී වැඩිහිටියාගේ සිට බාලයා තෙක් සඟ මහලු

පිළිවෙළට රංග භූමියට පිවිසෙන්නේ එහි ගුණය මේ තුළ අන්තර්ගත වී තිබීම නිසා ය. තව ද පන්ති කාමර ක්‍රියාවලියේ දී පන්ති කාමර පරිසරය අනුව ද ආගම දහමට නැඹුරු වූ සංස්කෘතිය අගයන පුද්ගලයකු එම ඉගෙනුම් පරිසරයෙන් නිර්මාණය කෙරේ. බුදුන්ට පහන් දල්වා සරස්වතී දේවිය වන්දනා කිරීම ද බොහෝ අවස්ථාවල දී දැකිය හැකි ය.

එසේ ම මෙකී අවස්ථාවන්හි දී පරිහරණය කරනු ලබන භාණ්ඩ ගරුත්වයකින් යුතු ව පරිහරණය කිරීම නර්තන විෂය හැදෑරීමේ දී දරුවන්ට හුරු වන්නේ නිරායාසයෙනි. තමා නර්තනය කිරීමට ප්‍රථම බෙරයට නමස්කාර කිරීම ද, භූමියට නමස්කාර කිරීම ද මෙයට කදිම උදාහරණ වේ. මේ අනුව පුද්ගලයා සාමාන්‍ය ජීවිතයේ දී ද තමා පරිහරණය කරනු ලබන දෑ අගය කිරීමට හා ගරු කිරීමට පෙලඹෙයි.

## නිර්මාණශීලිත්වයට නැඹුරු වීම

නර්තන විෂයය හැදෑරීමේ දී සෞන්දර්යාත්මක අත්දැකීම් ලබා ගනිමින් විවිධ නිර්මාණ බිහි කිරීමට යොමු වන අතර, ඊර්ෂ්‍යාව ක්‍රෝධය හා පළි ගැනීම වැනි දුර්ගුණ ඉවත් වේ. හොඳ විචාරශීලී සමානාත්මතා ගුණය අගයන පුද්ගලයෙක් බිහි වේ. මෙ මඟින් සමාජ හිතකාමී නම්‍යශීලී පුද්ගලයෙක් බිහි වෙයි. එසේ ම මානසික ඒකාග්‍රතාව ඇති වීමෙන් සිතෙහි සමාධිගත තත්ත්වයක් ඇති වන අතර හිතකාමී සමාජයක් නිර්මාණය කිරීම සඳහා මෙමගින් ලැබෙන වටිනාකම අපමණ ය.

නර්තන විෂය පෞද්ගලික රුචිකත්වය ඇති කිරීමේ ලා සමත් වූ විෂයයකි. නර්තන විෂයය වින්දන ශක්තිය වර්ධනය කිරීමට උපකාර වේ. ඒ නිසා ම අද පාසල් විෂයමාලාව තුළ අනෙක් විෂයයන් හා සසඳන කල කුසලතා ඔප් නැංවීමට එයින් මනා පිටිවහලක් ලැබේ. විවිධ ප්‍රසංග, ක්‍රීඩා උත්සව, සාහිත්‍ය සමිති, ආගමික උත්සව වැනි අවස්ථාවන්හි දී නර්තන විෂයය අනිවාර්යයෙන් ම සම්බන්ධ වීම මීට නිදසුනක් ලෙස දැක්විය හැකි ය.

ප්‍රායෝගික ක්‍රියාකාරකම් මඟින් මධ්‍ය ස්නායු පද්ධතියේ ක්‍රියාකාරිත්වය නිරතුරු ව සිදු වන අතර, එය නිරවුල් මනසක් මෙන් ම නීරෝග පුද්ගලයකු බිහි වීමට ද හේතු වෙයි. සිතෙහි තර්කානුකූල බවක් ඇති වීමටත්, හොඳ නරක නිවැරැදි ව තෝරා ගැනීමටත් සමාජයේ වගකීම් දරන පුද්ගලයකු බිහි කිරීමටත් නර්තන විෂය උපකාරි වේ.

ප්‍රායෝගික ක්‍රියාකාරකම්වල දී විලම්බ, මධ්‍ය, දෘත ලයට නැටීම, දිගු වේලාවක් චිත්ත ඒකාග්‍රතාව රඳවා ගැනීමටත් විඳ දරා ගැනීමේ කායික හා මානසික ශක්තිය වර්ධනයටත් හේතු වේ.

මේ අනුව නර්තන විෂයය හැදෑරීමෙන් කායික හා මානසික වශයෙන් සමබර පෞරුෂයක් ඇති, සංස්කෘතික සාරධර්ම අගයන ගුණ ගරුක පුද්ගලයකු බිහි වෙති යි කීම නිවැරැදි ය.

## නර්තන කලාවේ සමාජීය වටිනාකම් ඇගයීම

### සහජීවනය හා නායකත්ව ගුණාංග

පුද්ගලයා සංවර්ධනය වීමෙන් මුළු මහත් සමාජය ම යහපත් සමාජයක් කරා යනු නො අනුමාන ය. මෙහි දී විශේෂයෙන් සංස්කෘතික හර පද්ධතීන් ආරක්ෂා කිරීම අවශ්‍ය වේ. මේවා අතර ශාන්තිකර්මයන්හි දී සිදු කෙරෙන ආගන්තුක සත්කාරය, බතබුලතින් සංග්‍රහ කිරීම, ශිල්පීන් අතර ආචාර සමාචාර ආදිය මූලික ව දැක්විය හැකි ය. විශේෂයෙන් ශාන්තිකර්ම අවස්ථාවල දී මේවා විදහා දැක්වේ. එසේ ම පන්තිකාමර ක්‍රියාවලියේ දී කණ්ඩායම් ක්‍රියාකාරකම් මඟින් පුහුණු කරනු ලබන්නේ ද සමාජීය වශයෙන් පොදු කටයුත්තක් සඳහා සහභාගි විය යුත්තේ කෙසේ ද යන්න යි. මෙහි දී නායකත්වයට ගරු කිරීමටත් නායකයාගේ උපදෙස් අනුව කටයුතු කිරීමටත් පෙරහුරුවක් ලබා දේ. සියලු දෙනාගේ ම අදහස් පිළිබඳ ව අවධානය යොමු කරමින් සමානාත්මතා සංකල්පයට ගරු කිරීමත් මෙ මඟින් සිදු වේ. විශේෂයෙන් එකට වාඩි වී ශාන්තිකර්ම නැරඹීමත්, පන්තිකාමර ඉගෙනුම් ක්‍රියාවලියේ දී ද බිම වාඩි වී ශිල්ප ශාස්ත්‍ර හැදෑරීමත් උදාහරණයක් ලෙස දැක්විය හැකි ය. මෙහි දී සමාජය තුළ පවත්නා පන්ති භේද, කුලභේද, උස් පහත්කම් තුරන් වී සමාජ සහජීවනයක් ඇතිවීම නිතැතින් ම සිදු වේ.

එසේ ම සෞන්දර්යාත්මක සිතිවිලි මඟින් වින්දන ශක්තියත් යහපත් ආකල්පත් වර්ධනය ද සිදුවන අතර, සාරධර්ම වර්ධනය මඟින් ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, පළිගැනීම ආදි දුර්ගුණාංග පහ ව ගොස් ගැටුම්කාරී තත්ත්වයන් ගෙන් තොර වූ සමාජයක් බිහි වීමට මඟ පෑදේ.

### වේදිකා ප්‍රසංග

ප්‍රසංග වේදිකාවට නර්තන කලාව පිවිසීම නිසා අත්පත් වන්නා වූ ප්‍රතිඵල සමුදායක් එක් අතෙකින් විවේකය ඵලදායී ලෙස ගත කිරීමටත්, වින්දන ශක්තිය දියුණු කර ගැනීමටත් ලැබෙනුයේ මහත් රුකුලකි. ජීවිතයේ විඩාබර අවස්ථාවන්ට මඳ අස්වැසිල්ලක් ලබා ගැනීමට ද නර්තන ප්‍රසංග නැරඹීම ඉවහල් වේ.

මෙ මඟින් විවිධ නිර්මාණ එළිදකින අතර, ඒවා අගය කිරීමට පමණක් නොව විවිධ කලාකෘති නිර්මාණකරණයට යොමු වීමට ද පෙලඹවීමක් සිදු වේ.

වර්තමානයේ වෘත්තීය වශයෙන් නර්තන කණ්ඩායම් බිහි වන අතර ඔවුහු ප්‍රසංග වේදිකාවට පැමිණීමෙන් සමාජයේ ජනප්‍රිය පුද්ගලයන් බවට පත් වෙති. එපමණක් නොව ආර්ථිකමය වශයෙන් ලබා ගන්නා වාසිය ද මෙහි ලා සඳහන් කළ හැකි ය.

ප්‍රසංග සඳහා උසස් නිර්මාණ ඉදිරිපත් කිරීමෙන් ජනතාවට වැදගත් සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් නර්තන කලාව යොදා ගැනීමට ද අවස්ථාවක් සැලසේ. තව ද දේශීය අනන්‍යතාව රැක ගැනීමටත් ඒවා අඛණ්ඩ ව මේ වන තෙක් පවත්වාගෙන ඒමටත් මෙ මඟින් දායකත්වයක් ලබා දිය හැකි ය.

ශිල්පීන් තම දක්ෂතා ප්‍රදර්ශනය කිරීමෙන් ලබන තෘප්තිය මෙන් ම ප්‍රේක්ෂක ප්‍රතිචාර මඟින් ද ලබනුයේ අපමණ ආත්ම තෘප්තියකි. එමෙන් ම ප්‍රේක්ෂකයෝ ද කලා කෘති නැරඹීමෙන් මානසික තෘප්තියක් ලබති. තව ද කලා කෘතියක හොඳ නරක තීරණය කොට නිවැරදි විනිශ්චයක් ලබා දීමට ද ඔවුහු පෙලැඹෙති. වර්තමානයේ සංගීත ප්‍රසංග ඉදිරිපත් කිරීමේ දී ගීත අනුව නර්තන ඉදිරිපත් කිරීම ද ජනතාවට ඉතා සමීප ජනප්‍රිය අංගයකි. කුමන තරාතිරමක පුද්ගලයකු වුව ද නර්තනය පිළිබඳ ව උගත් නූගත් කාටත් පොදු රසවින්දනයකට යොමු කිරීමට මෙමඟින් අවස්ථාව සැලසේ. ගුණාත්මක බව කෙසේ වුව ද නාට්‍යමය ගුණයෙන් යුක්ත ගීත අනුව නර්තනය යොදා ගන්නා අවස්ථා ද නැත්තේ නොවේ. එපමණක් නොව අද්‍යතනයේ නර්තන කණ්ඩායම් තම ජීවන වෘත්තිය සඳහා නර්තන කටයුතුවල නිරත වීම හා ඔවුන් සමාජයේ ගෞරවයට පාත්‍රවීමත් දැකිය හැකි ය. ප්‍රමාණාත්මක ව තරගකාරී බවින් යුතු නව නිර්මාණ බිහිවීමට අවකාශයක් ලැබීම ද සමාජීය වශයෙන් හිමි වන වාසියකි.

## අන්තර් ජාතික සම්බන්ධතා

නර්තන කලාව හැදෑරීමෙන් අප විසින් අත්පත් කරගනු ලබන විශේෂ ගුණාංගයක් ලෙස අන්‍ය කලාකෘති අගය කිරීම දැක්විය හැකි ය. විවිධ රටවලට හා විවිධ ජාතීන්ට අයත් නර්තන කලාවන් හැදෑරීමටත් ඒවා අගය කිරීමටත් පෙලඹවීම ඇති කරනු ලබන්නේ මෙකී ගුණාංගය නිසා ය. එසේ ම, එම කලා කෘතිවලට විචාරවත් ව නැඹුරු වෙමින් එකී ආභාස දේශීය නර්තන නිර්මාණය කිරීමේ දී ඉවහල් කර ගැනීමට අවස්ථාවක් සැලසෙනු ඇත. තව ද, අංගහාර රංග වස්ත්‍රාභරණ, අංග රචනය, සංගීතය ආදි අංශවලින් ඇති වන දියුණුව ද මෙහි ලා දැක්විය හැකි ය. විශේෂයෙන් ඉන්දියානු, ඉන්දුනීසියානු, මැලේසියානු ආභාස නිසා වර්තමානයේ රංග වස්ත්‍රාභරණවලට ගල් අල්ලා අලංකාර කිරීම ආදිය මෙයට මනා උදාහරණ වේ.

එසේ ම නර්තන කලාව හැදෑරීමට යොමු වීමෙන් විදේශීය නර්තනයන් හැදෑරීමට පෙලඹවීමක් ඇති වන අතර විදේශීය රටවලට ගොස් ඒවා අධ්‍යයන කිරීමට අවස්ථාව ලබා ගැනීම නිසා විදේශීය සිසු සම්බන්ධතා, ගුරු සිසු සම්බන්ධතා ඇති වීමෙන් අන්තර්ජාතික සම්බන්ධතා ගොඩ නගා ගැනීමටත්, අන්‍ය සංස්කෘතීන් හඳුනා ගැනීමටත් අවකාශය සැලසේ.

තව ද විදේශීය සංචාරවල දී සන්දර්ශන පවත්වා දේශීය නර්තන කලාව ලෝකයාට හඳුන්වාදීමට ද එපමණක් නොව රාජ්‍ය ආයතනවලට නර්තන කලාව සම්බන්ධ වීම නිසා ද ශිෂ්‍යත්ව ලබා ඒ යටතේ විදේශ ගතවීමට ද ඒ ඒ නර්තන කණ්ඩායම්වලට අන්තර්ජාතික උළෙළවල් නියෝජනය කිරීමට ද අවස්ථාව සැලසේ. උදාහරණ වශයෙන් ජාතික තරුණ සේවා සභා නර්තන කණ්ඩායම්, සංස්කෘතික අමාත්‍යාංශය යටතේ රාජ්‍ය නැටුම් කණ්ඩායම්, ත්‍රිවිධ හමුදාවන්ට අයත් නර්තන කණ්ඩායම් ආදිය දැක්විය හැකි ය. මෑත භාගයේ දී අධ්‍යාපන අමාත්‍යාංශය, සංස්කෘතික අමාත්‍යාංශය එක් ව සිදු කළ චෝගම් ප්‍රදර්ශනය' මනා නිදසුනකි. මෙහි දී පොදු රාජ්‍ය මණ්ඩලීය රාජ්‍ය නායක සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වූ අතර, රාජ්‍ය නායකයන් පිළිගැනීම සඳහා පාසල් නර්තන කණ්ඩායම්, කලායතන නර්තන කණ්ඩායම් සංස්කෘතික මධ්‍යස්ථාන ආදිය හා සම්බන්ධ වීම මෙහි ලා සඳහන් කළ හැකි ය.

එපමණක් නො ව නර්තනය, විශ්වවිද්‍යාල මට්ටම දක්වා පැතිරී තිබෙන අතර, එමඟින් විදේශීය රටවලට ගොස් ඒ පිළිබඳ ව ආචාර්ය උපාධි, ලබා ගත හැකි වීම ද විශ්ව විද්‍යාලයීය ආචාර්ය වරුන්ට ශිෂ්‍යත්ව ලබාගත හැකි වීම ද මෙමඟින් සිදු වන තවත් වාසියකි. එසේ විවිධ නර්තන ශෛලීන් හැදෑරීමට ලැබෙන ඉඩ ප්‍රස්තාව මඟින් විෂය සංවර්ධනයට ලැබෙනුයේ ඉමහත් උපකාරයකි.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


| | | |
|---|---|---|
| උඩරට නැටුම් කලාව | - | සේදරමන්, ජේ.ඊ.<br>ඇම්.ඩී. ගුණසේන සහ සමාගම<br>කොළඹ 1979 |
| කෝලම් නාටක හා ලංකාවේ වෙස් මුහුණු | - | එම්.එච්. ගුණතිලක<br>රත්න ප්‍රකාශක - 1964 |
| නර්තනයට අත්වැලක් | - | ජා.අ.ආ.<br>ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය 2000 |
| නර්තනය 10 ශ්‍රේණිය | - | මල්ලවආරච්චි, ස්ටැන්ලි ග්‍රේෂන්<br>මල්පියළි 2000 |
| පහතරට නැටුම් | - | සචරිස් සිල්වා, එස්.එච්.<br>එම්.ඩී. ගුණසේන 1965 |
| සබරගමු නැටුම් කලාව | - | කේ.ඊ. සුසිලරත්න<br>සෙනරත් ප්‍රකාශන 2006 |
| සිංහල නර්තන කලාව | - | දිසානායක, මුදියන්සේ<br>ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ<br>1998 |